# විභාෂා

2011 නොවැම්බර්-දෙසැම්බර් | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි | දෙවන වෙළුම | දෙවන කලාපය

# භාෂා අයිතීන් උල්ලංඝනය කරලා ; විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නඩු

කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) විසින් පවත්වනු ලබන පාඨමාලා රැසක් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වාගෙන යාම නිසා ශ්‍රී ලාංකික ද්‍රවිඩ පුරවැසියන්ගේ භාෂා අයිතිය උල්ලංඝනය වී ඇති බැවින් ඒ පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට - එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කටයුතු යොදමින් සිටී.




ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv වන පරිච්ඡේදයේ භාෂාව පිළිබඳ ප්‍රතිපාදන දක්වා ඇත. එහි 21 වන වගන්තිය වෙන්වී ඇත්තේ ඉගෙන්වීමේ මාධ්‍ය පිළිබඳ නීති තත්වය දැක්වීමටයි. එම ව්‍යවස්ථාවෙහි සඳහන්ව ඇත්තේ මෙසේ ය.

21. (1) යම් තැනැත්තකුට ජාතික භාෂා දෙකෙන් කවර මාධ්‍යයකින් වුව ද අධ්‍යාපනය ලැබීමට හිමිකම ඇත්තේ ය:

එසේ වුව ද ජාතික භාෂාවක් නොවන භාෂාවක් ඉගැන්වීමේ භාෂා මාධ්‍ය වන උසස් අධ්‍යාපන ආයතනයකට මෙම අනු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

(2) රජය විසින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ මුදල් සපයනු ලබන යම් විශ්ව විද්‍යාලයක යම් පාඨමාලාවක් සඳහා නැතහොත් යම් අංශයක හෝ පීඨයක ඉගෙන්වීමේ මාධ්‍ය එක් ජාතික භාෂාවක් වන අවස්ථාවක එම විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට කලින් අනෙක් ජාතික භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා ඇති ශිෂ්‍යයන් වෙනුවෙන් එකී අනෙක් ජාතික භාෂාව ද එකී පාඨමාලාව සඳහා නැතහොත් එකී අංශයෙහි හෝ පීඨයෙහි ඉගැන්වීමේ මාධ්‍යයක් කළ යුත්තේ ය:

එසේ වුව ද එකී විශ්ව විද්‍යාලයේ වෙනත් යම් මණ්ඩපයක හෝ ශාඛාවක හෝ ඒ හා සමාන වෙනත් යම් විශ්ව විද්‍යාලයක යම් මණ්ඩපයක හෝ ශාඛාවක හෝ ඒ හා සමාන පාඨමාලාවක් සඳහා නැතහොත් ඒ හා සමාන අංශයක හෝ පීඨයක ඉගැන්වීමේ මාධ්‍ය ඉහත කී අනෙක් ජාතික භාෂාව වන්නේ නම් මෙම අනුව්‍යවස්ථාවේ මෙයට ඉහතින් වූ විධිවිධාන අනුව ක්‍රියා කිරීමට බැඳීමක් නොවන්නේ ය.

(3) මෙම ව්‍යවස්ථාවෙහි ''විශ්ව විද්‍යාලය'' යන්නට කවර වූ හෝ උසස් අධ්‍යාපන ආයතනයක් ඇතුළත් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී, ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 12(1) හා (2) වගන්තිවලට අනුව කිසිම පුද්ගලයකු භාෂාව නිසා වෙනස්කොට නොසැලකිය යුතුය. භාෂාව සම්බන්ධ මූලික අයිතිවාසිකම 12(2) ව්‍යවස්ථාවේ ඇතුළත් වන්නේ මෙසේය.

12(2) කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුත්තේය.

එහෙත් කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) මගින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා රැසක් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයට සීමා වී ඇත.

- Diploma in Drug Abuse Management
- Bachelor of labour Education and
- Diploma in Labour Education
- Certificate Course in Counselling
- Psychology leading to Diploma

වැනි පාඨමාලා රැසක් පවත්වාගෙන යන්නේ සිංහල හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පමණි. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල පද්ධතියට අයත් වෙනත් කිසිම විශ්ව විද්‍යාලයක මෙම පාඨමාලා දෙමළ භාෂාවෙන් නොපවත්වන බව තමන් කළ විමර්ශණයකින් තහවුරු වී ඇතැයි මේ පිළිබඳ අදහස් දක්වමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නීති අංශයේ නිරාන් මහතා විභාෂා පුවත් හසුනට පැවසීය. ශ්‍රී ලංකාවේ වෙනත් විශ්ව විද්‍යාලයක හෝ එම පාඨමාලාව එසේ පවත්වාගෙන යනු ලබන්නේ නම් දෙමළ ජනයාට මෙම අසාධාරණය සිදු නොවන බවද ඔහු වැඩිදුරටත් පැවසීය.

කොළඹ විශ්ව විද්‍යාලය හැරුණු විට තවත් විශ්ව විද්‍යාල කිහිපයකම මෙසේ එක් භාෂාවකට පමණක් සීමා වූ පාඨමාලා රැසක් පවත්වාගෙන යනු ලබන බැවින් ඒ පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේ දී තමන් කටයුතු යොදන බවද ඔහු ප්‍රකාශ කළේය.

## භාෂා අයිතීන් ප්‍රවර්ධනය සඳහා එකතුවක් බිහිවේ

ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් ප්‍රවර්ධනය අරමුණු කරගත් සිවිල් සංවිධාන එකතුවක් ගොඩනගා ගැනීම පසුගිය දා සිදුවිය. මෙම සිවිල් සමාජ සංවිධාන එකතුවේ සාමාජිකයන් ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නැගෙනහිර එක්සත් කාන්තා සංවිධානය, ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් සුරැකීමේ ව්‍යාපාරය, ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය, මානව සහයෝගිතා පදනම - මන්නාරම, ග්‍රාමීය සංවර්ධන පදනම - වව්නියා, ග්‍රාමීය ආර්ථික සංවර්ධන සංවිධානය - පානම සහ ත්‍රිකුණාමලය සර්වෝදය ශ්‍රමදාන සංගමය කටයුතු කරති.

මේ වනවිට මෙම එකතුව මගින් උතුරු නැගෙනහිර භාෂා සංගම් 150 කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවා ඇති අතර භාෂා අයිතීන් පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 600 කට ආසන්න ප්‍රමාණයක් පවත්වා ඇත.

දෙසැම්බර් 10 වනදාට යෙදී තිබූ ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් ප්‍රවර්ධනය පිළිබඳ වූ මහජන සංවාදයක් පැවැත්වීමට ද මෙම සංවිධාන එකතුව කටයුතු යොදා තිබිණි.

එම මහජන සංවාදය පිළිබඳ විශේෂ වාර්තාවක් විභාෂා ඉදිරි කලාපයෙහි පළවේ.

# දුම්රිය පොළේ භාෂා සටන;

## නිවේදන කටයුතු භාෂා තුනෙන්ම ඇරඹේ



දුම්රිය ස්ථානවල දුම්රිය ගමනාගමනය පිළිබඳ තොරතුරු භාෂා තුනෙන්ම සිදුනොවීම සම්බන්ධව ලැබුණු විවිධ පැමිණිලි හා බලපෑම් හේතුවෙන් ඉදිරියේදී සියලු දුම්රිය ස්ථානවල නිවේදන කටයුතු භාෂා තුනෙන්ම සිදු කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇත.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ඇතුළු ආයතන රැසකට පසුගිය කාලයේ මේ පිළිබඳ පැමිණිලි රැසක් ලැබී තිබිණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද අනුරාධපුර දුම්රිය ස්ථානය ඇතුලු දුම්රිය ස්ථාන ගණනාවක නිවේදන කටයුතු සිංහල භාෂාවෙන් පමණක් සිදුවීම පිළිබඳ පැමිණිල්ලක් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබිණි.

දුම්රිය සැලසුම් අධ්‍යක්ෂ විජය සමරසිංහ මහතා මේ පිළිබඳ ප්‍රකාශයක් කරමින් පසුගිය දිනක කියා තිබුණේ ප්‍රධාන දුම්රිය ස්ථානවල හැර වෙනත් බොහෝ දුම්රිය ස්ථානවල භාෂා තුනෙන්ම නිවේදන කටයුතු සිදු නොවන බවයි. ඊට හේතුව කාර්ය මණ්ඩල සම්බන්ධ ගැටලු බව පැහැදිලි කළ ඒ මහතා ඉදිරියේ දී ඊට අවශ්‍ය කාර්ය මණ්ඩල පුහුණු කර මේ සඳහා යොදවන බව කියා සිටියේ ය.

ඒ අනුව එම කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම රාජ්‍ය භාෂ කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් පසුගියදා ඇරඹුනි. දැනට දුම්රිය ස්ථානවල නිවේදන කටයුතු කරන 50 දෙනකු සඳහා මෙම පුහුණුව ලබා දී ඇත.

විසිපස් දෙනකුගෙන් යුත් පළමු කණ්ඩායමට අවශ්‍ය පුහුණුව ලබාදීම නොවැම්බර් 28 සහ 29 යන දෙදින තුළ සිදුවූ අතර දෙවන කණ්ඩායමට පුහුණුව ලබාදීම දෙසැම්බර් 06 සහ 07 යන දෙදින තුළ සිදුවිය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් සිදුකළ මෙම පුහුණු කටයුතු සඳහා සම්පත් දායකත්වය ලබා දී ඇත්තේ කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන මධ්‍යස්ථානයයි.

මේ අනුව ඉදිරියේදී සියලුම දුම්රිය ස්ථානවල දුම්රිය ගමනාග මනය පිළිබඳ නිවේදන කටයුතු භාෂා තුනෙන්ම සිදුවීමට නියමිතය.

## වෙළඳපොළේ භාෂා අයිතිය ඉල්ලා ආයතන පහකට පැමිණිලි කෙරේ

මෙරට වෙළඳ පොළේ අලෙවි කෙරෙන ඖෂධ භාවිතා කිරීමට අදාළ උපදෙස් හා එම ඖෂධ පිළිබඳ අත්‍යවශ්‍ය තොරතුරු මෙරට ජාතික භාෂාවන සිංහල හා දෙමළ භාෂාවලින් පාරිභෝගිකයා වෙත ඉදිරිපත් නොකිරීම සම්බන්ධව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රාජ්‍ය භාෂා කොමිෂන් සභාව ඇතුළු ආයතන 5ක් වෙත පැමිණිලි කර ඇත.

පසුගිය විභාෂා කලාපයේ මුල් පුවතින් ද අප හෙළි කර තිබූ පරිදි මෙරට බොහෝ ඖෂධ නිෂ්පාදනයන්හි මූලික තොරතුරු සඳහන් කර ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි. එමගින් මෙරට පුරවැසියන්ගේ භාෂා අයිතීන් පමණක් නොව පාරිභෝගික අයිතීන්ද උල්ලංඝනය වන බව එහිදී අවධාරණය කර තිබිණි.

එබැවින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම ගැටලුවට සහනයක් ලබාගැනීම සඳහා මානව හිමිකම් කොමිෂම වෙත මෙන්ම පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය වෙතද තම පැමිණිලි ඉදිරිපත් කර ති බේ. මේ හැරුණු විට විලවුන් උපකරණ හා ඖෂධ තාක්ෂණික උපදේශක කමිටුව (CDDTAC), ත්‍රිභාෂාමය ශ්‍රී ලංකාවක් උදෙසා වූ ජනාධිපති මෙහෙවර හා ඖෂධ නියාමන අධිකාරිය වෙත ද මෙම පැමිණිලි ඉදිරිපත් කර ඇත.

## දෙමළ බසින් වැඩ කළ හැකි 350ක් පොලිස් සේවයට

උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල වෙසෙන දෙමළ ජනයා පොලිසිය වෙත ගොස් තම මවු භාෂාවෙන් කටයුතු කරගැනීමේ දී ඇතිවන ගටලු විසඳාගැනීමට ඉවහල් වන පියවරක් වශයෙන් එම ප්‍රදේශවල සේවය කිරීම සඳහා දෙමළ භාෂාවෙන් වැඩකළ හැකි පොලිස් නිලධාරීන් 350 දෙනකු පොලිස් කොස්තාපල්වරු ලෙස බඳවා ගැනීමට රජය පියවර ගෙන ඇතැයි මානව හිමිකම් දිනය නිමිත්තෙන් කොළඹදී පැවති මහජන සංවාදයක් අමතමින් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා පැවසී ය.

ආරම්භක පියවරක් වශයෙන් මෙම ක්‍රියාමාර්ගය ගෙන ඇති බවත් ඉදිරියේ දී මෙය තව දුරටත් පුළුල් කිරීමට හැකි වනු ඇතැයි තමන් අපේක්ෂා කරන බවද අමාත්‍ය වරයා මෙහිදී පැවසීය.

අමාත්‍යවරයා මෙම අදහස් පළකළේ දෙසැම්බර් 12 දින ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් ප්‍රවර්ධනය උදෙසා වූ සිවිල් සමාජ සංවිධාන එකතුව විසින් කොළඹ මහවැලි කේන්ද්‍රයේ පැවැත්වූ ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් ප්‍රවර්ධනය පිළිබඳව වූ මහජන සංවාදයේදී ය.



# භාෂා අයිතීන් ජයගැනීමටත් "කඩිනම්" සැලසුමක්

පුරාණ මාතෘකාවක් පිළිබඳ අලුත් සංවාදයක් රටතුළ වර්ධනය වෙමින් තිබෙන බව පෙනේ. ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් පිළිබඳව ඇති වී තිබෙන මේ සංවාදය සහ අලුත් උනන්දුව, කොතරම් අවංක සහ අර්ථාන්විත උනන්දුවක් දැයි ප්‍රශ්න කරන අයද ඒ අතර නැතුවා නොවේ.

එය අහේතුක සැකයක් ද නොවේ. ඉතිහාසයේ අපමණ කටුක සහ අමිහිරි අත්දැකීම් ඒ සැකයට පදනම්ව තිබේ.

ශ්‍රී ලංකාව තම ඉතිහාසය පුරා මුහුණ දුන් සියලු ප්‍රශ්න එක් ලැයිස්තුවක ලේඛණගත කළහොත් එම ලේඛණයේ මුලින්ම තිබෙන ප්‍රශ්නයක් වන්නේ මේ කියන භාෂා අයිතීන් පිළිබඳ ප්‍රශ්නයයි.

නිදහසෙන් පසු යුගයෙහි ක්‍රමයෙන් උග්‍ර වූ මෙම ප්‍රශ්නය පසු කලෙක මේ රට බිහිසුණු යුද ප්‍රපාතයක් වෙත ඇද දැමීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයක් වූ බවද රහසක් නොවේ.

ඒ මුල්ම යුගයෙහි පවා මෙම ප්‍රශ්නයෙහි බරපතලකම වටහා ගනිමින් ඒ පිළිබඳ නිසි පළිවෙතක මේ රට පිහිටුවා ලීමට උත්සාහ ගත් නායකයන් ද මේ රටේ නොතෙකුක් වූහ. සමහරවිට තම ජීවිත පවා පරදුවට තබමින් ඔවුහු ඒ උදෙසා ක්‍රියාත්මක වූහ. එහෙත් ඔවුන්ගේ උත්සාහය අභිබවා ගොස් ප්‍රශ්නය අවුල් කිරීමට උත්සාහ ගත්තෝම ජය ලැබූහ. අවසානයේ රටට උරුම වූවේ තිස්වසරක් තිස්සේ නොනිමී ඇවිළුණු යුද ගිනි දැල් ජාලාවකි.

දැන් යුද්ධය අවසන්ව තිබේ. යුද ගිනි දැල් නිවී ගොසිනි. යළි එවැනි විපතක් සිදු නොවන බවට ද ප්‍රතිඥා ලැබෙමින් තිබේ.

ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් පිළිබඳ නව සංවාදයක් ඇරඹෙමින් තිබෙන්නේ එවැනි පසුබිමක් යටතේ ය. භාෂා අයිතීන් පිළිබඳ මෙරට පුරවැසියන් දැනුම්වත් කෙරෙන විවිධ වැඩමුළු, සම්මන්ත්‍රණ, හා දේශන ඇතුළු විවිධ වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක වෙමින් තිබෙනු දක්නට ලැබේ.

බැලූ බැල්මට මේ යහපත් වර්ධනයකි. බිහිසුණු යුද වාතාවරණයක් යටතේ තිස් වසරක් පුරා යටපත්ව තිබූ විවිධ ගැටලු මේ යටතේ යළි සංවාදයට ලක්වෙමින් තිබේ. එහෙත් මේ පිළිබඳ මතුකරන ප්‍රශ්න අතරින් ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ බිම් මට්ටමේ ජනයා තම එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ගැටලු විසඳීම කෙරෙහි මේ සංවාද කොතරම් දුරට ඉවහල් වේද යන්නයි. **අතීත අත්දැකීම් මත පදනම්ව මෙබඳු සැක සංකා මතුවීම සාධාරණ වුවත් ඕනෑම විසඳුම් ක්‍රියාවලියක ආරම්භක පියවර වන්නේ ඒ පිළිබඳ මහජන උනන්දුව වර්ධනය කිරීම බව අප තේරුම් ගත යුතු ය. එම අර්ථයෙන් බලන විට මේ ඇතිවෙමින් තිබෙන උනන්දුව දෙස සුබවාදීව බැලීමට අප සමත් විය යුතු ය.**

භාෂා අයිතීන් පිළිබඳ මෙබඳු ප්‍රශ්න කෙරෙහි පොදු සමාජයේ මෙන් ම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කිරීමෙහි ලා ජනමාධ්‍ය සතු හැකියාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම මැදගත් ය. මෙහි දී ජනමාධ්‍ය පිළිබඳ අපට ඇති අතීත අත්දැකීම් එතරම් සතුටුදායක නොවූවත් ඒ පිළිබඳ බලාපොරොත්තු අත්හළ නොහැකි ය. විශේෂයෙන් භාෂා අයිතීන් සම්බන්ධව මෙරට සාමාන්‍ය ජනයා මුහුණ දෙන ගැටලු සමාජය හමුවේ තැබ්මෙහි වගකීම පැවරෙන්නේ ජනමාධ්‍යයටය. ජනමාධ්‍යවේදීන් මෙන් ම භාෂා අයිතීන් පිළිබඳ මැදිහත්ව ක්‍රියා කරන විවිධ බලපෑම් කණ්ඩායම් ද ජනමාධ්‍ය සතු මෙම හැකියාව තේරුම් ගනිමින් එය සමාජ ප්‍රගමනය සඳහා යොදා ගැනීමට ක්‍රියා කළ යුතු ය.

මෙයින් අදහස් කරන්නේ ජනමාධ්‍ය යොදා ගනිමින් මාධ්‍ය සන්දර්ශන පැවැත්වීමක් නොවේ. භාෂා අයිතීන් පිළිබඳ සැබෑ ගැටලු සමාජගත කරමින් ඊට විසඳුම් සෙවීමේ වේදිකාවක් ලෙස ජනමාධ්‍ය යොදා ගැනීමයි.

කෙසේ වෙතත් මෙය ජනමාධ්‍යයට හුදකලාව ඉටුකළ හැකි කාර්යභාරයක් ලෙස අධිතක්සේරු කළ යුතු ද නොවේ. මෙහි දී ජනමාධ්‍යයට ඇත්තේ ඊට අදාළ සමාජ ක්‍රියාකාරීත්වය සමඟ යන ඒකාබද්ධ ගමනකි. මේ පිළිබඳව අතීතයට සාපේක්ෂව විමසා බලන විට නම් අද ඇත්තේ කිසියම් සුබවාදී තත්ත්වයක් යැයි කෙනෙකුට කිව හැකි ය. භාෂා අයිතීන් උදෙසා ක්‍රියා කරන විවිධ සමාජ බලවේගවලට මෙන්ම ජනමාධ්‍යයට ද එරෙහිව මීට දශක කිහිපයකට පෙර එල්ල වූ ආකාරයේ අහිතකර බලපෑම් අද සෘජුවම එල්ල වෙන බවක් පෙනෙන්ට නැති බැවිනි.

අද දක්නට ලැබෙන ප්‍රධානම ගැටලුම නම් මේ පිළිබඳ ප්‍රමාණවත් කැපවීමක් හා උද්‍යෝගයක් වගකිව යුතු අංශ වෙතින් ප්‍රදර්ශනය නොවීමයි. මීට එක් සරල උදාහරණයක් ලෙස මෙවර විභාෂා කලාපයෙහි 16 වැනි පිටුවෙහි පළකෙරෙන ලිපිය යොදා ගත හැකි ය.

එම ලිපියෙහි කියැවෙන්නේ කොළඹ ටවුන් හෝල් ආසන්නයේ ඉදිකර ඇති රාජ්‍ය අංශයේ දැන්වීම් පුවරුවක් පිළිබඳ ගැටලුවකි. ශ්‍රී ලංකාවේ භාෂා අයිතීන් පිළිබඳ සංවේදීතාවයකින් තොරව මෙම පුවරුව ප්‍රදර්ශනය කෙරෙහි බැවින් එම තත්ත්වය වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපතිවරයාට ඇතිවිය ඒ අනුව එම පුවරුව ප්‍රදර්ශනය කරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල වගකිව යුත්තන් ඇමතූ සභාපතිවරයා සිදු වී ඇති වරද නිවැරදි කරන ලෙස දැනුම් දී මේ වන විට මාස ගණනාවක් ගත වී ඇතත් මේ දක්වා එම පුවරුවේ එක අකුරක්වත් වෙනස් වී නැත.

තවත් එක් උදාහරණයක් රාජ්‍ය භාෂා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතාම පසුගිය දිනෙක ඉදිරිපත් කළේ ය.

කොළඹ ජාතික කෞතුකාගාරය නැරඹීමට සිංහල මෙන්ම දෙමළ භාෂාව කතා කරන නරඹන්නන් විශාල පිරිසක් දිනපතා පැමිණෙති. ඒ අතරින් වැඩි දෙනෙක් දුර බැහැර පාසැල් සිසු සිසුවියන් ය. ඔවුනට කෞතුකාගාරය පිළිබඳ තොරතුරු විස්තර කරදීමට ජාතික කෞතුකාගාරයේ එකම දෙමළ සේවකයකු හෝ නැත. මෙම තත්ත්වයේ බැරෑරුම් කම තේරුම් ගත් අමාත්‍යවරයා මේ සඳහා කෞතුකාගාරයට දෙමළ භාෂාව භාවිතා කරන සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීම සඳහා මාස කිහිපයක් තිස්සේ බලපෑම් කරමින් සිටී. එහෙත් කිසිදු ප්‍රතිඵලයක් නැත.

මේ සංඥාවන් දෙකම මෙරට භාෂා අයිතීන් තහවුරු වූ අනාගත ශ්‍රී ලංකාවක් පිළිබඳ සිහිනයට හිතකර නොවේ. මේ මගින් පිළිබිඹු වන්නේ භාෂා අයිතීන් පිළිබඳ සංවේදීතාවයකින් තොර පරණ රටමය. මීට හේතුව මේ රටේ අප කවුරුත් සුලබව අත්විඳින අකාර්යක්ෂම පරිපාලනයේ ගැටලු යැයි කෙනෙකු කිව හැකි ය. 'නීති තියෙනවා ඒත් ක්‍රියාත්ම වෙන්නේ නෑ.' යැයි ද තව කෙනෙකු කිව හැකි ය. එහෙත් අද රටට අවශ්‍යව ඇත්තේ නිදහසට කරුණු නොව; ප්‍රශ්නයට විසඳුම් ය.

පරිපාලනයේ ගැටලු දැකීම අලුත් අත්දැකීමක් නොවන බව සොල්බරි කොමිසමේ සාක්ෂි විභාගයේදී සමස්ත ලාංකා දමිළ සංගමය දැක් වූ අදහසක් භාෂාව හා මනුශ්‍යත්වය කෘතියේ එස්.ජී. පුංචිහේවා මහතා මෙසේ උපුටා දක්වයි.

"ලංකාවේ දෙමළ ජනයාට ව්‍යවස්ථා දායකයෙන් සිදුවනවාටත් වඩා අසාධාරණ ලෙස සැලකීම සිදුවන්නේ පරිපාලන හෝ විධායක ක්‍රියා මගිනි, නැත්නම් නොකර හැරීම් මගිනි."

ශ්‍රී ලංකාව නිදහස ලැබීමටත් පෙර දවසක ලංකා දමිළ සංගමය ඉදිරිපත් කළ එම චෝදනාව අදටත් එසේම වලංගු නම් අප ලබා ඇත්තේ කෙබඳු නිදහසක් ද?

අනෙක් අතින් අවශ්‍යතාවය තිබේ නම් පරිපාලනය ගැටලුවක් නොවන බව සනාථ කර ඇති අවස්ථාද බොහෝ ය.

පළමුව යුද්ධයේ දී ද, දෙවනුව යුද්ධයෙන් පසු සිදුකරන "නගර සංවර්ධනය" ඇතුළු "කඩිනම් සංවර්ධන" ව්‍යාපෘතින්හීදී ද මේ බැව් යළි යළිත් සනාථ වී ඇත.

එබැවින් භාෂා අයිතීන් පිළිබඳ ප්‍රශ්නයට පමණක් මේ කියන පරිපාලන අකර්මන්‍යතාවය හේතුවක් වීමට ඉඩ නොදිය යුතු ය.

මක් නිසාද යත්, භාෂා අයිතීන් පිළිබඳ ප්‍රශ්නත්, ඒ හා බැඳී ඇති අනෙක් ප්‍රශ්නත් මේ රටේ ඇති වෙනත් කිසිදු ප්‍රශ්නයකට දෙවැනි නොවන බැවිනි.

# මානව හිමිකම් කොමිෂම වෙත පැමිණිලි ගලා එයි

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යටතේ ක්‍රියාත්මක වන ''සුළුතර ජාතිකත්ව භාෂා අයිතීන් ප්‍රවර්ධන හා බලගැන්වීමේ වැඩසටහන'' මෙරට භාෂා අයිතීන් කඩවීම පිළිබඳ පැමිණිලි 15ක් මේ වනවිට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා එහි ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කර ඇත. මේ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් කළ විමසුමට ලැබුණු ප්‍රතිචාර අනුව දැනටමත් ඊට අදාළ විමර්ශණ කටයුතු අරඹා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර දී ඇති ''නීතිය පසිඳලීමේදී සහ ක්‍රියාත්මක කිරීමේ දී නීතියේ රැකවරණයද සර්වසාධාරණ විය යුත්තේය'' යන මූලික අයිතිවාසිකම මෙහිදී කඩවී ඇතැයි යන පදනමින් මෙම පැමිණිලි ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති එම පැමිණිලි පිළිබඳ සාරාංශගත ලේඛනයක් පහත දැක්වේ.




**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනුකරන ලද පැමිණිලි**

| අනු අංකය | වගඋත්තරකරු | ගැටලුව | පැමිණිලි කළ කාර්යාලය | පැමිණිලි කල දිනය | නඩු අංකය |
|---|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා වවුනියාව හා පොලිස්පති තුමා | වවුනියාව පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථානවල දෙමළ භාෂාව කථාකරන පුද්ගලයන්ගේ පැමිණිළි හා ප්‍රකාශ පොලිසිය විසින් සිංහල භාෂාවෙන් සටහන් කිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3464/2011 |
| 2 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා අම්පාර හා පොලිස්පති තුමා | අම්පාර පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථානවල දෙමළ භාෂාව කථාකරන පුද්ගලයන්ගේ පැමිණිළි හා ප්‍රකාශ පොලිසිය විසින් සිංහල භාෂාවෙන් සටහන් කිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3467/2011 |
| 3 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා ත්‍රිකුණාමළය හා පොලිස්පති තුමා | ත්‍රිකුණාමලය පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථානවල දෙමළ භාෂාව කථාකරන පුද්ගලයන්ගේ පැමිණිළි හා ප්‍රකාශ පොලිසිය විසින් සිංහල භාෂාවෙන් සටහන් කිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3465/2011 |
| 4 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා මඩකලපුව හා පොලිස්පති තුමා | මඩකලපුව පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථානවල දෙමළ භාෂාව කථාකරන පුද්ගලයන්ගේ පැමිණිළි හා ප්‍රකාශ පොලිසිය විසින් සිංහල භාෂාවෙන් සටහන් කිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3463/2011 |
| 5 | ස්ථානාධිපතිතුමා දුම්රිය ස්ථානය මහව හා සාමාන්‍යාධිකාරිතුමා දුම්රිය දෙපාර්තමේන්තුව | දුම්රිය ස්ථානවලදී දෙමළ භාෂාවෙන් දුම්රිය ගමන් පිළිබඳ උපදෙස් විකාශනය නොකිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3470/2011 |
| 6 | ස්ථානාධිපතිතුමා දුම්රිය ස්ථානය පොල්ගහවෙල හා සාමාන්‍යාධිකාරිතුමා දුම්රිය දෙපාර්තමේන්තුව | දුම්රිය ස්ථානවලදී දෙමළ භාෂාවෙන් දුම්රිය ගමන් පිළිබඳ උපදෙස් විකාශනය නොකිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3471/2011 |
| 7 | ස්ථානාධිපතිතුමා දුම්රිය ස්ථානය ගල්ඔය හා සාමාන්‍යාධිකාරිතුමා දුම්රිය දෙපාර්තමේන්තුව | දුම්රිය ස්ථානවලදී දෙමළ භාෂාවෙන් දුම්රිය ගමන් පිළිබඳ උපදෙස් විකාශනය නොකිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3469/2011 |
| 8 | ස්ථානාධිපතිතුමා දුම්රිය ස්ථානය අනුරාධපුර හා සාමාන්‍යාධිකාරිතුමා දුම්රිය දෙපාර්තමේන්තුව | දුම්රිය ස්ථානවලදී දෙමළ භාෂාවෙන් දුම්රිය ගමන් පිළිබඳ උපදෙස් විකාශනය නොකිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3468/2011 |
| 9 | සභාපතිතුමිය නගර සභාව සභාව මහරගම | වීදි නාමපුවරු වල වීදිනාම දෙමළ භාෂාවෙන් සදහන් නොවීම පිළිබඳ පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3462/2011 |
| 10 | සභාපතිතුමා ප්‍රදේශීය සභාව තිරප්පනේ | වීදි නාමපුවරු වල වීදිනාම දෙමළ භාෂාවෙන් සදහන් නොවීම පිළිබඳ පැමිණිල්ල | ප්‍රාදේශීය කාර්යාලය අනුරාධපුරය | 08/11/2011 | HRC/AP/555/11/I |
| 11 | සභාපතිතුමා ප්‍රදේශීය සභාව තිරුක්කෝවිල් | වීදි නාමපුවරු වල වීදිනාම සිංහල භාෂාවෙන් සදහන් නොවීම පිළිබඳ පැමිණිල්ල | ප්‍රාදේශීය කාර්යාලය කල්මුණේ | 08/11/2011 | HRC/KL/177/11/R |

14 පිටුවට...





# භාෂා අයිතිය, අධ්‍යාපන අයිතිය හා ප්‍රජා සංවිධාන භූමිකාව

භාෂා අයිතිය පිළිබඳ කතා බහ කරන බොහෝ පර්ෂදයන්හි අවධානය යොමුවන්නේ ඊට අදාළ නීතිමය ප්‍රතිපාදන කෙරෙහි පමණක් බව සුලබව දක්නට ලැබේ. එහි වැදගත්කම අවතක්සේරු කළ නොහැකිය. එහෙත් නීතිමය ප්‍රතිපාදනයන්ගෙන් ඔබ්බට ගොස් බලන විට වෙනත් සමාජ, ආර්ථික හා දේශපාලන සාධක භාෂා අයිතිය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවධානය යොමු නොකිරීම බරපතල අඩුවකි.

උදාහරණයක් ලෙස භාෂා අයිතිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් ලෙස අධ්‍යාපන සාධකය සැලකිය හැකිය. අධ්‍යාපනය සඳහා සම අයිතියක් නැති තත්ත්වයක් තුළ භාෂා අයිතිය සර්ව සම ලෙස සාක්ෂාත් වේ යැයි පිළිගත නොහැකිය. මේ කාරණය ඉතා සරලව පැහැදිලි කරන්නේ නම්, සාක්ෂරතාවය, භාෂා අයිතිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් ලෙස පැහැදිලි කළ හැකිය. වෙනත් බොහෝ සම්පත් සම්බන්ධව මෙන්ම සාක්ෂරතාව සම්බන්ධයෙන්ද මේ රටෙහි විෂමතාවයක් පවතින බව රහසක් නොවේ. එක් අතකින් ගම හා නගරය අතර සාක්ෂරතා විෂමතාවයක් පවතින අතර තවත් අතකින් නගරය හා වතුකරය අතරගත් ගම හා වතුකරය අතරත් සාක්ෂරතා විෂමතාවයක් පවතී.

මෙම විෂමතාවයෙහි පදනම ඇත්තේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින මෙම විසමතාවය මුහුණුවර කිහිපයකින් හඳුනාගත හැකිය. 1997 සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකායේ වාර්තාව සඳහන් කරන පරිදි ශ්‍රී ලංකාවේ සමස්ත ළමා ජනගහනය අතරින් අනිවාර්යෙන් පාසල් යා යුතු වයස ලෙස ගැනෙන 5-14 අතර වයස් කාණ්ඩයේ ළමුන්ගෙන් 14%ක් පාසැල් නොයති. පස්වන ශ්‍රේණියේ ළමයින්ගෙන් ලිවීමේ ප්‍රවීණතා මට්ටමට එළඹ ඇත්තේ 1/5ක් පමණක් බවද එහි සඳහන් විය. 1995 අපොස (සා.පෙ) විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන්ගෙන් 10%ක් විෂයයන් අටම අසමත්ව තිබිණි. උසස් පෙළ සිසුන්ගෙන් සැම 1/11 දෙනෙක්ම විෂයන් හතරම අසමත්ව සිටියහ. මේ එවකට රටේ පැවැති පොදු තත්වයයි. රටේ අනෙකුත් කළාප සමග සසඳා බලන විට වතුකරයෙහි තත්වය පවතින්නේ බෙහෙවින් පසුගාමී මට්ටමක බැවින් එහි තත්වය වඩා සංවේගජනකය. මේ පිළිබඳව 2006 වසරේ අධ්‍යාපන අමාත්‍යංශය මගින් සපයා ඇති වාර්තාවන්ට අනුව 1 ශ්‍රේණියේ සිට 6 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ළමයින් අතරින් 6 ශ්‍රේණියෙන් ඔබ්බට යන්නේ 58%ක් පමණි. එනම් 42%ක් 6 ශ්‍රේණියෙන් පාසැල් හැර යති. 11-13 ශ්‍රේණිවලදී 93%ක් පාසැල් හැරයති. විශ්ව විද්‍යාල සුදුසුකම් ලබන්නේ 0.002%ක් පමණි. ඒ අනුව වතුකරය නියෝජිතය කරමින් විශ්ව විද්‍යාල සුදුසුකම් ලබන්නේ ළමුන් 10 දෙනෙක් පමණි.

සාක්ෂරතාව පිළිබඳ විසමතාවයද මේ අයුරින්ම පවතී. නාගරික අංශයේ සාක්ෂරතාව 94.5%ක් වන විට වතුකරයේ සාක්ෂරතාව 76.9%කි. 1996/1997 වසර සඳහා කළ සමීක්ෂණයකට අනුව නාගරික අංශයේ පාසැල් නොයන ප්‍රතිශතය නාගරික අංශයේ 5.9%ක් සහ ග්‍රාමීය අංශයේ 7.9%ක් වන විට වතුකරයේ 23.9%ක් වූ බව පාම් පදනම අන්තර් සැලසුම 2004 ජනවාරි කලාපය උපුටා දක්වමින් Human Security in the hill country ප්‍රකාශනය කියයි.

වතුකරයේ අධ්‍යාපනය කෙරෙහි දැඩිව බලපාන ප්‍රශ්නයක් වන්නේ ගුරු හිගයයි. 2003 මැයි වන විට දෙමළ මාධ්‍ය පාසැල් සඳහා ගුරු හිගය 10121ක් වන විට සිංහල මාධ්‍ය පාසැල් සඳහා ගුරු අතිරික්කය 6704ක් විය. (අධ්‍යාපන ප්‍රගතිය - 2003) ප්‍රමාණාත්මකව බලන විට මෙන්ම ගුණාත්මකවද ගුරු ගැටළුවල බලපෑම එල්ල වී ඇත. බොහෝ විට ඔවුන් සේවයට බඳවාගෙන ඇත්තේ අවම අධ්‍යාපන සදුසුකම් හා අවම පූර්ව සේවා සූදානමක් යටතේ ය. සේවාස්ථ ගුරුවරුන්ගේ තත්වයද එසේය. සිංහල මාධ්‍ය සේවාස්ථ උපදේශක හිගය 9%ක් වන විට දෙමළ මාධ්‍ය සඳහා 51%ක් හිගය.

මේ දැක්වෙන සංඛ්‍යාවන්හි අඩුවැඩි වීමත් තිබිය හැකි වුවද අද වන විටත් වතුකරය හා නගරය අතරත්, වතුකරය හා ගම අතරත්, අධ්‍යාපන සම්පත් බෙදීයාමේ බරපතල විසමතාවයක් ඇති බව පැහැදිළි කිරීමට ගණන් හිලව්ම අවශ්‍ය නොවේ. එම විසමතාවය බැලූ බැල්මටම පෙනෙන්නට තිබෙන්නකි.

අනෙක් අතින් අධ්‍යාපනය කෙරෙහි බලපාන්නේ සෘජු පහසුකම් පමණක් ද නොවේ. ගමනාගමන පහසුකම්, නිවාස, ජලය, සෞඛ්‍ය, සනීපාරක්ෂක පහසුකම්වල තත්වය සහ පවුලේ ආදායම් මට්ටමද එහිලා තීරණාත්මක ලෙස බලපෑම් කරයි. ඒ අනුව ඊට අදාළ දත්ත පදනම් කරගනිමින් 1990 දී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සංයුක්ත දර්ශකයක් ගණනය කර තිබේ.

එහිදී කොළඹ දිස්ත්‍රික්කය සඳහා දර්ශකය 77ක් පෙන්නුම් කරන විට මොනරාගල දිස්ත්‍රික්කය සඳහා දර්ශකය 41ක් පෙන්නුම්කරමින් මෙම සාධකයන්හි විසමතාවය මනාව තහවුරු කර තිබිණි. සමස්ත බස්නාහිර පළාත සඳහා දර්ශකය 65ක් වන විට ඌව පළාත සඳහා 45 කි. මධ්‍යම පළාත් සඳහා 50 කි. ඌව සහ මධ්‍යම යනු වතුකර කලාපය නියෝජනය කරන කලාප බැවින් මෙම විසමතාවයද වැඩි වශයෙන් අහිතකර ලෙස බලපා ඇත්තේ වතුකරය කෙරෙහි බවට සැකයක් නැත. පළාත් තුළම වුවද ගම සහ වතුකරය අතර මෙම සම්පත් බෙදී යාමේ විසමතාවයක් පවතින බව පැහැදිලි කරුණකි. එබැවින් අධ්‍යාපනය සඳහා යටිතලපහසුකම් ලෙස හැඳින්විය හැකි මේ පහසුකම් බෙදීයාමේ විසමතාවය වතුකරයේ අධ්‍යාපනය කෙරෙහි දරුණු ලෙස බලපාන බව නිසැකය.

මේ හැරුණු විට විධිමත් අධ්‍යාපනය සමග සෘජුවම බැඳී ඇති ක්ෂේත්‍ර පහක් හඳුනාගත හැකිය.

I. අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු වීම
II. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියණු වීම.
III. ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා දියුණු කිරීම.
IV. ගුරු අධ්‍යාපනය හා ගුරු පුහුණුව
V. සම්පත් සැපයීම හා කළමනාකරණය.

මෙම ක්ෂේත්‍ර පහ සම්බන්ධයෙන්ද වතුකරයෙහි පවතින්නේ යහපත් තත්වයක් නොවන බව පැහැදිලය. මේ සියලු සාධක අනුව අධ්‍යාපනය සඳහා ඇති සම අයිතිය සම්බන්ධයෙන්

10 පිටුවට

# භාෂා හා සංවර්ධන ජාත්‍යන්තර සමුළුව

තිස් වසරක යුද්ධය නිමා වීමෙන් පසු ශ්‍රී ලංකාව මේ ගතකරමින් සිටින යුගයට බෙහෙවින් වැදගත් වන ජාත්‍යන්තර සමුළුවක් පසුගිය ඔක්තෝබර මස 17 වැනිදා සිට 19 වැනිදා දක්වා දින තුනක් පුරා කොළඹ දී පවත්වන්නට යෙදුණි.

''භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ ජාත්‍යන්තර භාෂා හා සංවර්ධන සමුළුව'' නමින් හැඳින්වූ එහි තේමාව වී තිබුණේ'' භාෂාව හා සමාජ ඒකාබද්ධතාව'' යන්නයි.

නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව පොර බැදූ ගැටලු අතරින් භාෂා අයිතිය ප්‍රධානතම ගැටලුවක් වූ බව රහසක් නොවේ. යුද්ධය කෙරෙහි බලපෑ විවිධ සාධක අතර භාෂා සාධකය ඉදිරියෙන්ම තිබෙන බවද රහසක් නොවේ.

එබඳු තත්වයක් යටතේ මෙබඳු සමුළුවක් මෙ රටෙහි පැවැත්වීම බෙනවින් වැදගත් වන අතරම, ඉන් ලැබෙන ප්‍රතිඵලද සමාජයට දැනෙන සුළු විය යුතුය.

ජනාධිපතිතුමා, විද්‍යාත්මක කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය තුමා, සහ අධ්‍යාපන අමාත්‍යංශය ඇතුළු අමාත්‍යංශ නිලධාරීන් සැලකිය යුතු පිරිසක් රාජ්‍ය අංශය නියොජනය කරමින්ද, රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරමින් සැලකිය යුතු පිරිසක්ද,, විශ්ව විද්‍යාල ඇතුළු අධ්‍යාපන ආයතන නියෝජනය කරමින් සැලකිය යුතු විද්වතුන් පිරිසක්ද, ජාත්‍යන්තර ප්‍රජාව නියෝජනය කරමින් සැලකිය යුතු විදෙස් නියෝජිත පිරිසක්ද මෙම සමුළුවට සහභාගි වී සිටියහ.

එහිදී ඉතා වැදගත් අදහස් රැසක් පළවූ බවද වාර්තා වේ. ඒ පිළිබඳ කිසිදු විවාදයක් නැත.

එහෙත් පශ්චාත් යුදමය තත්ත්වයක් පසු කරමින් සිටින රටක මෙම සමුළුවෙන් ලැබුණු ප්‍රතිඵල කවරේද? මෙවැනි සමුළුවක් කෙරෙහි ඇතිවූ අවධානය ප්‍රමාණවත් ද? යන ප්‍රශ්න මෙහිදී මතු කිරීමට සිදුවේ. මේ පිළිබඳ ප්‍රමාණවත් සංවාදයක් සමාජයෙහි සිදුවුවේ ද? මෙහි සිදුවූ සංවාදය පිළිබඳ සමාජයීය දැනුවත් භාවය ප්‍රමාණවත්ද? මේ පිළිබඳ උනන්දුමත් ජනකණ්ඩායම් සහ ප්‍රජා සංවිධාන අතර එබදු දැනුවත්භාවයක් සිදුවූ බවක් පෙනෙන්නට නැත. එවැනි තත්වයක් යටතේ මෙම සමුළුව මේ රටෙහි පවත්වන බොහෝ සමුළු අතර තවත් එක් සමුළුවක් පමණක් වූවේ ද යන ප්‍රශ්නය මතුවීම වැලැක්විය නොහැකිය.

නිදහසෙන් පසු ගෙවී ගිය ඉතිහාසය පුරා භාෂා අයිතිය පිළිබඳ ගැටලුව සමග පොර බදා බොහෝ තුවාල සිදුකරගත් රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ එය එසේ සිදුවිය යුතු නැත.

මේ පිළිබඳ සංවාදය ජනතාව අතරට ගෙන යා යුතුය. ජනතාවට දැනෙන වෙනසක් සිදුවිය යුතුය.

කෙසේ වෙතත් මෙම සමුළුව අමතමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා දැක්වූ අදහස් කිහිපයක් පාඨක අවධානය සඳහා මෙහි පළ කෙරේ.



## ශ්‍රී ලංකාව සියලු ජාතීන්ගේ භාෂා අයිතීන් සුරැකීමට කැප වෙනවා

**භාෂා හා සංවර්ධන ජාත්‍යන්තර සමුළුවේදී ජනපති කියයි.**

“ සමාජ ඒකාබද්ධතාව තහවුරු කර ගැනීමෙහිලා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි භාෂාව ඉටු කරන කාර්යභාරය අපි අවබෝධ කරගෙන සිටිමු. ඒ අරමුණු ඇතිවයි. ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය ඉගැන්වීමේ නව ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත්තේ. එමගින් ජගත් දැනුමේ සහ තාක්ෂණයේ නවතම ප්‍රගතිය අප රටේ සියලු ප්‍රදේශවලට පතුරාලීම අපගේ අදහසයි. ”

භාෂාව සහ සංවර්ධනය පිළිබඳ නවවන සමුළුවේ සත්කාරක රට ලෙස ශ්‍රී ලංකාව තෝරා ගැනීම ගැන මුලින්ම මගේ සතුට පළ කරනවා. මා විශ්වාස කරනවා ශ්‍රී ලාංකික ඉතිහාසයෙහි මෙම සමුළුව මෙහි පවත්වන්නට ලැබීම ඉතා වැදගත් බව.

ශ්‍රී ලංකාවෙහි අපි සාමයේ හඬ නගමු. දිගු කලක සිට පැවැති ගැටුම, ප්‍රචණ්ඩත්වය නිමවීමෙන් සහ අප ජනතාව දුක් කරදර රැසක් අත් විඳීමෙන් පසුව මෙම සමුළුව කොළඹදී පැවැත්වීමට ඔබ ගත් තීරණය අද අප රට පුරා සාමය පවතින බවට තවත් එක් සාක්ෂියක්. දශක තුනක් තිස්සේ අප ප්‍රචණ්ඩත්වය සහ විනාශය අත්විඳි කාලය තුළ කිසිවකු මෙහි පැමිණීමට කැමැති වුයේ නෑ. එහෙත් ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමෙන් පසු පැවැති තත්ත්වය විශාල වෙනසකට බඳුන් වීමෙන් පසු වාණිජ කටයුතු, විවේක සුවය විඳීම සහ ශාන්ත පරිසරය අත්විඳීම සඳහා බොහෝ දෙනකු ශ්‍රී ලංකාව තෝරා ගෙන ඇති බව අපි දන්නවා.

සන්නිවේදනය සහ අන්‍යොන්‍ය අවබෝධය සඳහා භාෂාව මෙවලමක් බව අපි කවුරුත් දනිමු. එහෙත් අපේ අම්හිරි අත්දැකීම් වන්නේ භාෂාව, ගැටුම් සහ බෙදුම්වාදය මතු කරන සාධකයක් ද විය හැකි බවයි. මේ නිසා භාෂාව සහ සමාජ ඒකාබද්ධතාව තේමාව කරගත් මෙම සමුළුව අප රටට කාලීන අවශ්‍යතාවක් ඉටු කරන බව නිසැකයි. එමෙන්ම සංවර්ධනය වන වෙනත් රටවලට ද මෙම සමුළුවේ කාර්යභාරය ඉතා වැදගත් බව මා දකිනවා.

අප රටේ ජනතාව භාෂාව භාවිත කරමින් සමගියෙන් බැඳ තැබීමේ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව වර්තමානයෙහි ක්‍රියාත්මක කරයි. අප රටේ ජීවත් වන විවිධ ප්‍රජාවන් අතර සම්බන්ධීකරණ භාෂාවක් ලෙස ඉංග්‍රීසිය සහ ජනතාවගේ භාෂාවන් භාවිත කිරීමේ අයිතීන් සුරැකීමට ද, එමගින් ශ්‍රී ලංකාව ත්‍රෛභාෂික රටක් බවට පරිවර්තනය කිරීමට ද අපි ඇප කැප වී සිටිමු. අප රටේ දරු දැරියන්ට දැනුම රැස් කර ගැනීමේ මාධ්‍ය ඉංග්‍රීසි බවට පත් කෙරෙන්නේ අප රට මෙම කලාපයේ දැනුමේ කේන්ද්‍රය බවට පත් කිරීම අපගේ බලාපොරොත්තුව නිසාය. කෙසේ වෙතත් අපගේ මූලික අරමුණ නම් අප රටේ ජනතාව ජනවර්ග භේදයකින් තොරව සිංහල සහ දෙමළ යන ප්‍රධාන භාෂාවන් ඉගෙන ගැනීම සහ ඒවා භාවිත කිරීමෙන් එකිනෙකා අතර සන්නිවේදනය සහතික කිරීමයි.

අප සමාජය තුළ විවිධත්වය පෝෂණය කිරීමට උපකාරී වීම අරමුණු කරගෙන භාෂාවන් ඉගැන්වීමේ ක්‍රමවේදයන්/වර්ධනයන් ඉගෙන ගැනීමට අප සූදානම්. ආර්ථික සංවර්ධනය සඳහා විශේෂයෙන්ම අප රටේ තරුණ තරුණියන්ට රැකියා අවස්ථා සුලබ කිරීම සඳහාත් සමාජය තුළ ජනතාවගේ ප්‍රගතිය සහ ගෝලීය ආර්ථිකය තුළ ක්‍රියාකාරී සහභාගිත්වයට මගපාදා ගැනීමට ද භාෂාවන්හි වැදගත්කම අපි අවබෝධ කරගෙන සිටිමු.

සමාජ ඒකාබද්ධතාව තහවුරු කර ගැනීමෙහිලා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි භාෂාව ඉටු කරන කාර්යභාරය අපි අවබෝධ කරගෙන සිටිමු. ඒ අරමුණු ඇතිවයි. ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය ඉගැන්වීමේ නව ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත්තේ. එමගින් ජගත් දැනුමේ සහ තාක්ෂණයේ නවතම ප්‍රගතිය අප රටේ සියලු ප්‍රදේශවලට පතුරාලීම අපගේ අදහසයි.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා 2009 වසර ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳ වසර ලෙස ප්‍රකාශයට පත් කළෙමු. එසේ කළේ අධ්‍යාපනයෙහි ඉතා වැදගත්

14 පිටුවට..



# මව් බස අහිමි මුහුදු වැදි ජනයා

**ශ්‍රී ලංකාවේ ආදි වාසී ජන කණ්ඩායම් සියල්ලම පාහේ ස්වකීය භාෂාමය හා සංස්කෘතිමය අනන්‍යතාව සම්බන්ධයෙන් අභියෝග රැසකට මුහුණ දී සිටින බව රහසක් නොවේ. ඒ අතරින් වැඩිම අවධානමට ලක්ව තිබෙන්නේ වාකරේ ආදිවාසීන්ගේ භාෂාමය හා සංස්කෘතික අනන්‍යතාවයි. වැදි භාෂාව මේ වන විටත් මුළු මනින්ම පාහේ ඔවුන් වෙතින් දුරස්ව ගෝසිනි. දෙමළ වැදි ජනයා ලෙස ප්‍රකටව සිටින වාකරේ මුහුදු වැදි ජනයාගේ ජීවන තතු මෙම ලිපියෙන් විමසා බැලේ.**

"අපට අපේ කිසි ම කටයුත්තක් කර ගන්න ප්‍රවාහන පහසුකම් නෑ. හැතැප්ම හයක් පයින් ගියාම තමයි බස් පාර හම්බුවෙන්නේ. අපේ කිසිම දියුණුවක් ඇති නොවෙන්න හේතුව ඒකයි."

කන්නමුත්තු සෙල්ලතම්බි සෝකයෙන් තෙත්වූ දෙනෙතින් යුතුව පවසයි. ඔහු කුඤ්ඤන්කුලම් ගමේ ආදිවාසී නායකයා ය. දෙමළ වැද්දන් ලෙස ප්‍රකට ව සිටින මේ ජන කොට්ඨාසය ජීවත්වන්නේ මඩකලපුව වාකරේ ප්‍රදේශයේ ය. එහි ජීවත්වන ආදිවාසී පවුල් සංඛ්‍යාව 67කි. මොවුන්ගේ විශේෂත්වය වන්නේ ආදිවාසී භාෂාව වෙනුවට දෙමළ භාෂාව කතා කිරීමත් ඇතැම් පිරිස් කිතුනු ලබ්ධිකයන් වීමත් ය. කුඤ්ඤකුලම්හි කොළනි ඉඩම්වල පදිංචි වීමට පෙර ඔවුන් ජීවත් ව ඇත්තේ කාරමුණේ වනගහනය මැද ය. මානිකේනි ප්‍රදේශයෙන් කුඹුරු අක්කර තුනක් හා ගොඩ ඉඩම් අක්කරයක් බැගින් ලබා දීමෙන් ඔවුන් එහි පදිංචි කරවන ලදි. පසුව 80 දශකයෙහි ඇවිල ගිය යුදමය තත්වය හේතුවෙන් එයින් පිරිසක් කුඤ්ඤංකුලම් ගම්මානයට පැමිණ පදිංචි විය.

"දැනට මී කඩන්න යන්නෙ කලාතුරකින්. එහෙම යනවා නම් ආමි එකෙන් පර්මිට් ගන්න ඕනෑ. වැඩි දෙනෙක් කරන්නෙ කුඹුරු වැඩ. කුඹුරුවල කුලී වැඩට මහියංගනයට යනවා. වැවේ මාළු අල්ලනවා. කරවල වේලලා විකුනනවා". ආදි වාසී නායකයා තම රැහේ ඇත්තන්ගේ ජීවන කර්මාන්ත ගැන පවසයි. වාකරේ මහුදු වැද්දන්ගේ නායකයා පසුගියදා ආදිවාසී සමුළුවට ද සහභාගි වූයේ ය. එහි දී ඉල්ලීම් වූයේ මේවා ය.

01. මාර්ග පිළිසකර කර දීම
02. ගමට බස් රථයක් ලබා දීම
03. රෝහල් පහසුකම් ලබා දීම
04. ගමට විදුලිය ලබා දීම
05. කුඹුරු ගොවිතැන සහ පානය සඳහා ජල පහසුකම් ලබා දීම

සමුළුවට සහභාගි වීමෙන් පසු ව මේ ඉල්ලීම් එකක් හෝ ඉටුවනු ඇතැයි ආදිවාසී නියකයා බලාපොරොත්තු තබා ගෙන සිටී.

මෝට්ටුකාට්ටු යනු ආදිවාසීන්ගේ දෙවියන් බවත් වත්මනෙහි තමන් විසින් අදහනු ලබන්නේ මාරිසුම්මාන් දෙවියන් බවත් ආදිවාසීහු කිහිපදෙනෙක් පැවැසූ හ.

"ගමට ම තියෙන්නේ බොන ළිං දෙකයි. වතුර ගේන්න හැතපුමක් විතර පයින් යනවා. වැව හිඳෙන නිසා නාන්න තැනක් නැහැ. අපේ දුක ජනාධිපති තුමාටවත් කියන්න කෙනෙක් නැහැ. නාන්න යෑමත් දුෂ්කර වෙලා. අනේ අපේ දුක්ගැනවිලි ජනාධිපතිතුමාටවත් කියන්න. කුඤ්ඤකුලම් ගමේ නායකයාගේ බිරිය වන කනපතී රාසම්මා පවසයි. තමන් පදිංචිව සිටින නිවස තනා දුන්නේ හමුදා කඳවුරෙන් බවත් විවිධ සංවිධානවලින් යම් යම් උදව් උපකාර ලැබී ඇති බවත් ඇය පවසයි.

**මාන්කේනි ධීවර ගම්මානයේ සභාපති විජය කුමාර් විවාහ වී සිටින්නේ ආදිවාසී නායකයාගේ වැඩුමල් දියණිය සමඟ ය. ඇගේ නම දයාබදී ය. ඔවුන්ගේ වැඩිමහල් පුතා නෝබට් ය. දෙවැනියා ජේම්සන් රාජ් ය. එයින් පෙනෙන්නේ ඔවුන්ගේ නම් වල ස්වභාවයයි.**

දැන් ගොඩාක් අය දෙමළ අය එක්ක මිශ්‍ර වෙලා ඉන්නේ. ඒ නිසා මව් භාෂාව දන්නේ නැහැ. කථා කරන්නෙ දෙමළ. මුස්ලිම් අය  සමහර වෙලාවට අපට වැද්දො කියලා බනිනවා. මාළු බිස්නස්වලදී ආරවුල් ඇති වීම ඊට හේතුවයි. "මාන්කේනි ධීවර සංගමයේ සභාපති විජය කුමාර් පවසයි. "අපේ ආදිවාසීන්ගේ දේපළ සුනාමියට අහුවුනා. රජයේ සහ වෙනත් ආයතනවල සහයෝග යෙන් අඩුපාඩු හදාගත්තා බෝට්ටු 12ක් ලැබුණා. සමිතිය මගින් බෝට්ටු 120ක් ලැබිලා තියෙනවා". විජයකුමාර් පවසයි.

**පාක්‍යරාසා සිරි නන්දනී එක්දරු මවකි.**

ඇගේ සැමියා කුලී වැඩවලින් ජීවිකාව සපයා ගනී. කුඩා කල සිට දෙමළ භාෂාව කථා කරන සමාජයක හැදුණු නිසා තමන් දන්නේ දෙමළ භාෂාව වුවත් තම පියා මව් භාෂාව හොඳින් දන්නා බවත් ඇය පවසයි.

"යුද්ධ කාලේ බොහෝ දෙනෙකුගේ හැඳුනුම්පත් නැති වුණා. හැඳුනුම්පත් හදලා දුන්නා. විවාහ නොවී සිටින බොහෝ පවුල් රෙජිස්ටාර්වරයෙකු ලවා විවාහ කරවීමට ආමි එකේ මහත්වරු මැදිහත් වුණා. අපේ ගමේ පවුල් 67 න් පවුල් 33 ක් නියම ආදිවාසීන් හැටියට ජීවත් වනවා. එහෙත් මේ තත්වය ඉක්මණින් වෙනස්වීම කනගාටුවට කරුණක්."

**පාක්‍යරාසා සිරිනන්දනි පවසයි.**

මේ ආදිවාසීන්ගේ දරුවන් ඉගෙනුම ලබන්නේ දෙමළ මාධ්‍ය පාසැල්වල ය. ඒ නිසා ඔවුන් හින්දු සංස්කෘතියට අයත් ප්‍රජාවක් ලෙස සමාජගත වන ආකාරයක් හදුනාගත හැකි ය. මදුරන්කේලිකුලම් අරසිනල් දෙමළ මාධ්‍ය පාසලේ ඉගෙනුම ලබන රංජනි ජයන්ති මාලා මෙවර (2010) සාමාන්‍ය පෙළ විභාග යට පෙනී සිටීමට සුදානම් වෙයි. එහෙත් විදුහලේ ඇති අඩුපාඩුකම් නිසා අනාගතය පිළිබඳ ව  ඇගේ සිත්හි පවතිනුයේ අවිනිශ්චිත බවකි. "මාත් එක්ක හතර දෙනෙක් විභාගයට ලියනවා. ඒත් ගණිතය හා සිංහලවලට ගුරුවරු නෑ. ක්‍රිස්තියානි පල්ලියයි කොවිලයි දෙක ම තියෙනවා. මේ නිසා පාසලේ ආගම අදහන වෙලාවට දෙගොල්ලෝ වෙන වෙනම චාරිත්‍රවල යෙදෙනවා."

මදුරන් කේනිකුලම් වසමේ ග්‍රාම නිළධාරිවරයා පවසන පරිදි කුඤ්ඤංකුලම ගමෙහි කොටසක

**14 පිටුවට..**

# පුරවැසියන්ට මවු භාෂාවෙන් කටයුතු කිරීමට ඇති අයිතිය උල්ලංඝනය නොකරන්න

## ඇමැති වාසුගෙන් උපදෙස්

මිහිරි ෆොන්සේකා
2011-10-13 ලක්බිම

රාජකාරි අවශ්‍යතා සඳහා පැමිණෙන පුද්ගලයකු තමන්ගේ මවු බසින් කතා කරන විට ඒ භාෂාව දැනගෙනත් වෙනත් භාෂාවකින් කතා කරන රජයේ නිලධාරීන්ට එරෙහිව පියවර ගන්නා බව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ඇමැති වාසුදේව නානායක්කාර මහතා පවසයි.

මේ වන විට සිය අමාත්‍යාංශය මගින් සිංහල නිලධාරීන්ට දෙමළ භාෂාවද, දෙමළ නිලධාරීන්ට සිංහල භාෂාව උගන්වමින් සිටින බවත්, එවැනි භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත් වී වැටුප් වර්ධකද හිමිකර ගත් නිලධාරීන් දෙවැනි භාෂාවෙන් රාජකාරි නොකරන බවට තමාට නිරීක්ෂණය වී ඇති බවත් ඇමැතිවරයා කීය.

නිලධාරීන් එසේ කිරීමෙන් පුරවැසියන්ට තම මවු භාෂාවෙන් කටයුතු කිරීමේ අයිතිය උල්ලංඝනය වන බැවින් එසේ කිරීමෙන් වළකින ලෙස ඇමැතිවරයා ඉල්ලීමක් කරයි. මේ තත්ත්වය වැළැක්වීමට නම් යම් කාලයකට සිංහල නිලධාරීන් දෙමළ ජනතාව සිටින ප්‍රදේශවලටද දෙමළ නිලධාරීන් සිංහලයන් සිටින ප්‍රදේශවලටද සේවා මාරුවීම් දිය යුතු බවත්, එසේ වුවහොත් ඔවුන් ඉගෙනගත් දෙවැනි භාෂාව හැසිරවීමට ඉබේටම හුරුවනු ඇති බවත් ඇමැතිවරයා පෙන්වා දෙයි.

ඕනෑම පුරවැසියකුට සිය මවු භාෂාවෙන් වැඩ කිරීමට අවස්ථාව සැකසීම රජයේ භාෂා ප්‍රතිපත්තිය වන බවත් මේ පහසුකම සැලසීමේ අරමුණින් තම අමාත්‍යාංශය මේ මොහොත වන විට රජයේ නිලධාරීන් විසිහය දහසකට දෙවැනි භාෂාවක් උගන්වමින් සිටින බවත් කීය.

වාසුදේව නානායක්කාර ඇමැතිවරයා මේ බව කීවේ රාජගිරිය බුත්ගමුව පාරේ පිහිටි ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ පැවැති පුවත්පත් සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු කීවේ උතුර හා නැගෙනහිර දෙපළාත්වලට සිංහල භාෂාවෙන් පමණක් මුද්‍රණය කර ඇති රාජකාරි ලිපි ලේඛන, පත්‍රිකා, පෝරම යැවීම නතර කර ඇති බවයි. යම් නිලධාරියකු එම නියමය කඩ කර සිංහලයෙන් පමණක් ලිපි ලේඛන යවන්නේ නම් විස්තර ඇතිව තමාට ඒ බව ඇනුම් දෙන ලෙස ඇමැතිවරයා කීය.

සිංහල හා දෙමළ යන දෙභාෂාවෙන්ම වැඩ කළ හැකි අංශයන් තම අමාත්‍යාංශය සතුව ඇති බවත් සෑම අමාත්‍යාංශයකටම සිංහල හා දෙමළ යන ද්වි භාෂාවෙන් වැඩ කළහැකි අංශයක් පිහිටුවීම තමාගේ අරමුණ බවත් ඇමැතිවරයා වැඩිදුරටත් කීවේය.



# දැනුම තිබියදී භාෂා පරිවර්තක සහාය ගත්තොත් දිරි දීමනා නෑ

## රාජ්‍ය පරිපාලනයෙන් ආයතන ප්‍රධානීන්ට චක්‍රලේඛයක්

ජයන්ත සමරකෝන්
2011-10-20 ලංකාදීප

භාෂා ප්‍රවීණතාව ඇති එහෙත් රජකාරි කටයුතුවල දී පරිවර්තකයන්ගේ සහාය ලබාගන්නා රාජ්‍ය නිලධාරීන්ගේ දිරිදීමනා අත්හිටුවීමට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය තීරණය කරයි.

අමාත්‍යාංශ ලේකම් පී.බී. අබේකෝන් මහතා මේ සම්බන්ධයෙන් සියලුම අමාත්‍යාංශ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් වෙත චක්‍රලේඛයක් මගින් උපදෙස් දී තිබේ .සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ලබා සිටින බොහෝ රාජ්‍ය සේවකයන් දිරිදීමනාව ද ලබා ගනිමින් රාජකාරි කටයුතු භාෂා පරිවර්තකයින් මගින් ඉටුකර ගැනීම මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට හේතුවී ඇත.

භාෂා ප්‍රවීණතාව ඇති රාජ්‍ය සේවකයන් භාෂා පරිවර්තක සහාය ලබා නොගත යුතු බව ද එසේ සිදු කරන්නේ නම් ඔවුන්ගේ දිරි දීමනා අත්හිටුවිය යුතු බව ද එම චක්‍රලේඛයේ දැක්වේ. රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගය සමත් කනිෂ්ඨ සේවකයන්ට රුපියල් 15,000ක් ද ලිපිකරු ශ්‍රේණියේ සේවකයන්ට රුපියල් 20,000ක් ද මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට රුපියල් 25,000ක් ද වශයෙන් දිරි දීමනාවක් ගෙවනු ලබයි.

# රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීමට සමීක්ෂණයක්

අනුෂා ගුරුසිංහ
2011-10-12 දිනමිණ

බස්නාහිර පළාතේ රජයේ ආයතන තුළ නිසි අයුරින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සොයා බැලීමට විශේෂ සමීක්ෂණයක් සිදු කෙරේ.

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතාගේ උපදෙස් මත ක්‍රියාත්මක මෙම සමීක්ෂණයට අනුව කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්කවල පොලිස් ස්ථාන 12, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13, රෝහල් 14ක් හා උසාවි සංකීර්ණ 04ක් ආවරණය වන ලෙස සමීක්ෂණ කටයුතු සිදුකිරීමට නියමිතය.

මෙම ආයතන තුළ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය වර්තමානයේ ක්‍රියාත්මක වන අයුරු සොයා බැලීම හා ගැටලු හඳුනාගැනීම සඳහා 75 පමණ සමන්විත සමීක්ෂණ කණ්ඩායමක් යොදවා ඇත. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරන එම සමීක්ෂණ කණ්ඩායමට අවශ්‍ය පුහුණුව හා උපදේශන කටයුතු හා මෙම සමීක්ෂණය පැවැත්වීමේ අරමුණ පිළිබඳ දැනුවත් කිරීම පසුගියදා එම අමාත්‍යාංශයේදී සිදුවිය.

එමෙන්ම මෙහිදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි ලෙස බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කිරීමේ දී භාවිතා කළයුතු උපක්‍රම පිළිබඳ සොයා ඒවා ඉදිරි වැඩසටහන්වලදී යොදා ගැනීමට ද මෙහිදී බලාපොරොත්තු වේ.

බස්නාහිර පළාතේ මෙම සමීක්ෂණය අවසන් වූ පසු දිවයිනේ අනිත් පළාත් ද ආවරණය වන පරිදි මෙය ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමට අපේක්ෂිතය.

ුවධානය යොමුකිරීමත් ඒ පිළිබඳ
වෙනුවෙන් ජනමාධ්‍යයට කළහැකි
විශාලය.

ා දෙමළ පුවත්පත් කිහිපයක පළවූ
කි. මෙරට ජනමාධ්‍ය මගින් භාෂා
න් කෙසේදැයි මෙයින් විමසා බැලේ.




# රජයේ නිලධාරීන්හට ලබා දුන් භාෂා පුහුණුවේ පලදායිතාව සහතික කරලීමට පියවර ගන්නවා

**– අමාත්‍ය වාසුදේව නානායක්කාර**

මහේෂ්වරන් ප්‍රසාද්
දෙහිවල ගල්කිස්ස විශේෂ වාර්තාකරු
**තිනකරන්** - 2011-10-13

භාෂා පුහුණුව ලැබූ රජයේ සේවකයන් ඔවුන් ලද පුහුණුවෙන් ප්‍රයෝජන ගත හැකි හා එය වැඩි දියුණු කරගත හැකි වැඩසටහන් ක්‍රියාවට නැඟීමට නියමිතව ඇති බව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා ප්‍රකාශ කරයි.

රජයේ සේවකයන්ට ලබාදෙමින් තිබෙන භාෂා පුහුණුවෙන් වැඩි පලදායිතාවක් අත්පත් කර ගැනීම අරමුණු කොට ගෙන මෙකී වැඩසටහන් ක්‍රියාවට නගන බවත්, භාෂා පුහුණු ලද එහෙත් එය නිසි ලෙස භාවිතා කිරීමට උනන්දුවක් නොදක්වන පිරිසක්ද සිටින බවත්, එම නිසා එම දුර්වලතාවයන් මග හැරවීමේ අරමුණෙන් ඉදිරිපියවර යා යුතුව ඇති බවත් අමාත්‍යවරයා පෙන්වා දෙයි. විසිදහසකට වැඩි රජයේ සේවකයන් පිරිසකට මේ වනවිටත් දෙමළ හා සිංහල භාෂා පුහුණුව ලබා දී තිබේ. එසේම මොවුන් තුන්වන ශ්‍රේණියේ භාෂා පරීක්ෂණයෙන් ද සමත්ව සිටිති. එහෙත් මොවුන් ප්‍රායෝගිකව භාෂාව භාවිතා කිරීමේ හැකියාවක් නැති බව පෙනී යන්නේයැයි අමාත්‍ය වාසුදේව නානායක්කාර පවසයි.

වැඩි දුරටත් මේ පිළිබඳව අදහස් දැක් වූ අමාත්‍යවරයා භාෂා පුහුණුව ලද රජයේ නිලධාරීන් එය නිසි ලෙස භාවිතා නොකරන නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීමේ විශේෂ යාන්ත්‍රණයක්

ක්‍රියාත්මක කරන බවත්, ඒ සඳහා අවශ්‍ය කරුණු සොයා බැලීමත් සිදුවන බවත් ප්‍රකාශ කරයි.

එසේම අමාත්‍යංශ සහ රජයේ දෙපාර්තමේන්තු යනාදියෙහි දෙමළ භාෂා භාවිතය අවධාරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබෙන බවද ඔහු වැඩි දුරටත් පැවසීය.

පසුගිය මැතිවරණ සමයේ උතුරේ රාජ්‍ය දෙපාර්තමේන්තුවක් වෙත සිංහලෙන් පමණක් ලියැවුණු ලිපියක් යවා ඇතැයි ද ඒ සම්බන්ධයෙන් තම අවධානය යොමුකර ඇතැයි ද අමාත්‍යවරයා කියා සිටී.

ඉදිරියේ දී මෙවැනි ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය නිසි පියවර නිසි වෙලාවට ගන්නා බවත්. මේ වන විටත් මේ වැනි ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇති බවත් අමාත්‍යවරයා පෙන්වා දෙයි.

## වාර්ගික සංහිඳියාව වර්ධනය කිරීම සඳහා රට පුරා භාෂා සංගම්

**වාසුදේව නානායක්කාර**

එම්.අයි. මුහමඩ් ෆයිසල්
මෙට්‍රෝ නිව්ස් 2011-10-21

දීප ව්‍යාජන මට්ටමින් රට පුරා භාෂා සංගම් පිහිටුවා ජනවර්ග අතර ජාතික සංහිඳියාවක් ඇති කිරීමටත්, ජනතාවට විවිධ භාෂාවන් ඉගෙනීමට අවශ්‍ය වැඩපිළිවෙළක් මේ වන විටත් අරඹා ඇති බව ජාතික භාෂා හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර අමාත්‍යවරයා, කියයි,

පසුගිය කාලයේ ජනවර්ග අතර ක්‍රෝධයත්, බේද බින්නවීමත් ඇති කිරීම සඳහා භාෂාවන් භාවිතා වී තිබෙනවා. එහෙත් මේ වන විට එම තත්වය වෙනස් වී තිබෙනවා. දශක තුනක් තිස්සේ පැවති ත්‍රස්තවාදය වනසා දමා උතුරු නැගෙනහිර ප්‍රදේශවලත් ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස ක්‍රියාත්මක කොට තිබෙනවා. හදිසි නීතියත් ඉවත් කර තිබෙනවා.

මේ අතර රටපුරා දීප ව්‍යාප්ත මට්ටමින් භාෂා සංගම් ඇති කර, මෙම සංගම් මාර්ගයෙන් ජනවර්ග අතර බහුවිධ භාෂා නිපුණතාවයන් ඇති කරලීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීමෙන් ජනවර්ග අතර අන්‍යොන්‍ය අවබෝධයත්, සහජීවනයත් ඇති කරලීමට පියවර ගැනීම බෙහෙවින් පලදායී ක්‍රියාමාර්ගයක් වන බව වාසුදේව නානායක්කාර අමාත්‍යවරයා පෙන්වා දෙනවා.

## දෙමළ මාධ්‍ය පාසල්වලට සිංහල භාෂා ගුරුවරුන් පත් කර එවන්නැයි ඉල්ලති.

අනුරාධපුර මධ්‍යම අතිරේක වාර්තාකරු
**තිනකරන්** - 2011-10-18

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දෙමළ මාධ්‍ය පාසල්වලට සිංහල භාෂා ගුරුවරුන් පත් කර එවන්නැයි දෙමාපියෝ ඉල්ලා සිටිති.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ වෙසෙන දෙමළ හා මුස්ලිම් දරු දැරියන් සිංහල බස නොදැනීමෙන් අපහසුතාවයකට පත්ව සිටිති. දෙමළ බස කතා කරන බහුතරයක් දෙමළ ජනයා සිංහල බස නොදනිති. එසේම සිංහල බස කතා කරන බහුතරයක් දෙනා දෙමළ බස නොදනිති. මේ තත්ත්වය ප්‍රශ්න රැසක් ඇති කිරීමට හේතු වී තිබේ.

මෙම කරුණු සැලකිල්ලට ගෙන දෙමළ හා මුස්ලිම් පාසල්වලට සිංහල බස උගන්වන ගුරුවරුන් පත් කරලීමට වගකිව යුතු නිසි පියවර ගත යුතුව ඇතැයි ප්‍රදේශයේ දෙමව්පියෝ අවධාරණය කරති.

## සිංහල භාෂා ගුරුවරයකු පත් කරන්නැයි ඉල්ලති

දෙණියාය වාර්තාකරු
**තිනක්කුරල්** 2011-10-23

මාතර දිස්ත්‍රික්කයේ ඇති දෙමළ මාධ්‍ය පාසල්වල දෙවන බස වශයෙන් සිංහල ඉගැන්වීමේ හැකියාව ඇති ගුරුවරුන් පත් කරන්නැයි ප්‍රදේශයේ දෙමවුපියෝ හා ආදි ශිෂ්‍යයෝ ඉල්ලා සිටිති.

මාතර දිස්ත්‍රික්කයේ ඇති දෙමළ මාධ්‍ය පාසල්වල ඉගෙනුම ලබන දෙමළ හා මුස්ලිම් සිසුන් භාෂා ප්‍රශ්වනලට මුහුණ දී සිටිති. දෙමළ බස කතා කරන එකී සිසුන් බහුතරය සිංහල බස නොදනිති. මෙනිසා මොවුන්ට නොයෙක් අපහසුතාවයකට මුහුණදීමට සිදු වී තිබෙන බව දැනගන්නට ලැබී තිබේ.

මෙකී කරුණු සැලකිල්ලට ගෙන මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක දෙමළ මාධ්‍ය පාසල්වලට සිංහල බස ඉගෙන්වීමට සමත් ගුරුවරුන් පත් කර එවීමට වග කිවයුතු නිලධාරීන් කටයුතු කළ යුතුව ඇතැයි ප්‍රදේශයේ දෙමවුපියෝ හා ආදි ශිෂ්‍යයෝ කියා සිටිති.

# රාජ්‍ය භාෂා ලෝක කුසලානය දකුණු අප්‍රිකාවට

## දකුණු අප්‍රිකානු භාෂා පිළිවෙත

තම රටෙහි ජනගහනයෙන් 1.6 % ක් භාවිතා කරන භාෂාවක් ද රාජ්‍ය භාෂාවක් ලෙස පිළිගැනීමට දකුණු අප්‍රිකාව සමත්ව සිටී.

අතිශයින් සුළුතර ජන කණ්ඩායමකගේ වුවද භාෂා අයිතිය පිළිගනිමින් රටෙහි සංස්කෘතික විවිධත්වය තහවුරු කිරීම මගින් දකුණු අප්‍රිකාව භාෂා අයිතිය අරබයා මුළු මහත් ලෝකයටම මග පෙන්වීමක් කර ඇති අයුරු මෙම ලිපිය පැහැදිලි කරයි.

වර්ග කිලෝමීටර් 1,221,037 ක භූමි ප්‍රමාණයකින් යුතු දකුණු අප්‍රිකානු ජනරජය තුළ 50,586,757 ක ජනගහනයක් ජීවත්වේ. දකුණු අප්‍රිකාව අතිවිශාල සංස්කෘතික විවිධත්වයකට උරුමකම් කියන රටකි.විශේෂයෙන්ම අප්‍රිකානු ආසියානු පමණක් නොව යුරෝපීය සංස්කෘතික අංගයන් උරුමකරගත් පුරවැසියෝද මෙහි ජීවත්වෙති. කලක් තිස්සේ කළු සුදු බේදයට මුහුණ දෙමින් අදුරු පාලනකයකට උරුමකම් කියූ දකුණු අප්‍රිකාව පසුව 1996 වසරේදී, එකී අඳුරු සෙවනැලි මගහරිමින් නව මාවතකට පිවිසුණි.

සංස්කෘතියේ එක් අනිවාර්ය අංගයක්වන භාෂාව දකුණු අප්‍රිකානු ජනතාව කෙරෙහි සුවිශේෂි ලෙස බලපාන්නේ අතිවිශාල භාෂා ප්‍රමාණයක් හා උප භාෂා ප්‍රමාණයක් මෙහි ජනතාව භාවිතා කරන බැවිනි.


මෙවැනි විවිධත්වයක් සහිත රටක භාෂා පිළිවෙත සකස් කිරීමේදී බරපතල අභියෝග රැසකට මුහුණදීමට සිදුවීම ස්වභාවිකය. එහෙත් එම අභියෝග යට සාර්ථකව මුහුණ දීමට ඔවුහු සමත්ව සිටිති. ඒ 1996 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දකුණු අප්‍රිකාවේ භාවිතාවන ප්‍රධාන භාෂාවන් 11කට රාජ්‍ය භාෂා ලෙස නිළ පිළිගැනීමක් ලබාදීම මගිනි. මේ අතර බටහිර භාෂාවක් මෙන්ම බටහිර සම්භවයක් සහිත භාෂාවක්වන අප්‍රිකානා භාෂාවද ඇතුලත්වේ. අනෙක් භාෂා 9 අප්‍රිකානු ස්වදේශිකයන් භාවිතාකරන භාෂාවන්වේ.

මේ අනුව 1.6% කථා කරන න්ඩෙබෙල් බසද රාජ්‍ය භාෂාවක් ලෙස පිළිගැනීමෙන් දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැකිතාක් දුරට සිය සංස්කෘතික විවිධත්වය පිළිගැනීමට දරණ උත්සාය පැහැදිළිවේ.

එමෙන්ම ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව මගින්ම ස්ථාපිත සමස්ත දකුණු අප්‍රිකානු භාෂා මණ්ඩලය සියලු රාජ්‍ය භාෂාවන් මෙන්ම ආදි වාසී හා සංඥා භාෂා සංවර්ධනය සදහා ද කොන්දේසි නිර්මාණය කර තිබේ. එම කොන්දේසි ප්‍රවර්ධනය කිරීමත්, ජර්මන්, ග්‍රීක්, ගුජරාටි, හින්දි, පෘතුගීසි, දෙමළ, තෙලිඟු හා උර්දු ඇතුළු අප්‍රිකාව තුල සාමාන්‍යයෙන් කථාකරන භාෂාවන් හා ආගමික කටයුතු සදහා භාවිතා කරන අරාබි,හීබෘ,සංස්කෘතික ඇතුළු වෙනත් භාෂාවන් ප්‍රවර්ධනය හා ගෞරවය ආරක්ෂා කිරීම සඳහා ද දකුණු අප්‍රිකාව තම අවධානය යොමු කර තිබේ.

**2001 සංඛ්‍යා ලේඛනවලට අනුව දකුණු අප්‍රිකානු ප්‍රධාන භාෂා භාවිත කරන ප්‍රජාව පහත පරිදි දැක්විය හැකිය.**

| භාෂාව | කථාකරන්නන් | % |
|---|---|---|
| සුලු -Zulu | 10,677,000 | 23.8% |
| එක්ස්හෝනා Xhosa | 7,907,000 | 17.6% |
| අප්‍රිකාන්ස් Afrikaans | 5,983,000 | 13.3% |
| දකුණු සේතෝ Northern Sotho | 4,209,000 | 9.4% |
| ට්ස්වානා Tswana | 3,677,000 | 8.2% |
| ඉංග්‍රීසි English | 3,673,000 | 8.2% |
| සෝතො Sotho | 3,555,000 | 7.9% |
| ට්සොන්ගා Tsonga | 1,992,000 | 4.4% |
| ස්වාටි Swati | 1,194,000 | 2.7% |
| වෙන්ඩා Venda | 1,022,000 | 2.3% |
| න්ඩෙබෙලේ Ndebele | 712,000 | 1.6% |
| වෙනත් භාෂා | 217,000 | 0.5% |
| එකතුව | **44,820,000** | **100.0%** |




සටහන :

**නීතිඥ ජගත් ලියන ආරච්චි**

## භාෂා අයිතිය, අධ්‍යාපන අයිතිය...

5 පිටුවෙන්

වතුකරය සිටින්නේ බෙනෙවින් අවාසි සහගත තත්වයකය. අනෙක් අනිත් බැලූ බැල්මටම පෙනෙන කරුණක් වන්නේ මේ සියලු අවාසි සහගත තත්වයන් සඳහා කෙටිකාලීන විසඳුමක්ද නැති බවයි.

මෙම අවශ්‍යතා සපුරාලීමට සිදුවන්නේ දිගුකාලීන සංවර්ධන සැලැස්මක් ඔස්සේය. ප්‍රතිපත්ති සම්පාදන ක්ෂේත්‍රයේ සිට සංවර්ධන සැලසුම් හා ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග ඊට අදාළය. එබැවින් එබඳු පුළුල් ක්‍රියාදාමයක් සඳහා බලපෑම් කිරීම එක් මූලික අවශ්‍යතාවයකි. එහෙත් එබඳු වැඩපිළිවෙලකින් දිගුකාලීනව මෙම ප්‍රශ්න විසඳෙනතුරු බලා සිටීම ද ප්‍රමාණවත් වන්නේ නැත. මේ සඳහා විසඳුම් සෙවීමේ කඩිනම් වැඩ පිළිවෙලක්ද නිර්මාණය කර ගැනීම සමාජ වගකීමකි. එහිලා ප්‍රධාන වගකීමක් වතුකරය ආශ්‍රිත ප්‍රජා සංවිධානවලට පැවරේ.

භාෂා අයිතිය සාක්ෂාත් කරගැනීම සඳහා සාක්ෂරතාවයේ සිට ද්විභාෂා අධ්‍යාපනය හරහා පුළුල් අධ්‍යාපන දර්ශණයකට මගපෙන්වන වැඩපිළිවෙලක් ඒ යටතේ නිර්මාණය විය යුතුය.

ළමා පරපුර පමණක් නොව, දෙමාපියන්ද දැනුම්වත් කරමින් වතුකරය ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වන පුළුල් අධ්‍යාපන වැඩපිළිවෙලක් මේ මගින් අපේක්ෂා කෙරේ. මෙබඳු වැඩපිළිවෙලක මූලික ලක්ෂණ දෙකක් මෙසේ හඳුනා ගත හැකිය.

1. වතුකරයේ සුවිශේෂ තත්වයන්ට ගැලපෙන පරිදි සැලසුම් වීම
2. විධිමත් අධ්‍යාපනයේ රාමුවට සීමා නොවීම

ස්වභාෂා අයිතියේ සිට ද්විභාෂා අයිතිය දක්වා වතුකර ප්‍රජාව සවිබලගැන්වීමට සමත් වැඩ පිළිවෙලක් ඒ යටතේ නිර්මාණය විය යුතුය. අවසාන විග්‍රහයේදී එය භාෂා අයිතිය පිළිබඳ ජයග්‍රහණයක් පමණක් නොව, දියුණු සංස්කෘතික ජීවිතයක් සඳහා මගපෙන්වීමක්ද වනු ඇත.

**ශ්‍රී ලංකාවේ භාෂා ප්‍රතිපත්ති පිළිබඳ ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී 1956/33 පනතින් සිංහල රාජ්‍ය භාෂාව බවට පත් කිරීමේ අවස්ථාව තීරණාත්මක සන්ධිස්ථානයක් වූ අයුරු පසුගිය කලාපයෙන් අපි සාකච්ඡා කළෙමු. ඉන් පසු තවත් පනතක් පැනවීමට රජයට සිදුවිය. ඒ 1958/ 28 දෙමළ භාෂා භාවිතය පිළිබඳ පනතයි. එයින් රාජ්‍ය කටයුතු සඳහා දෙමළ භාෂාව භාවිතා කිරීමට නීති පැනවිණි. දෙමළ භාෂා භාවිතය පිළිබඳ අයිතිය තහවුරු කෙරෙන වගන්ති රැසක් එහි අඩංගු වූ නමුත් ඒ මගින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීමට හැකිවූයේ දැයි මෙම කලාපයෙන් විමසා බැලේ.**

# එදා මෙදා තුර භාෂා පිළිවෙත

## 56 පනත සහ 58 පනත

**නීතිඥ එස්. ජී. පුංචිහේවා**

> "සිංහල භාෂාවෙන් පරිපාලන කටයුතු සිදු කෙරෙන ප්‍රදේශයන් හි සිට දෙමළ භාෂාවෙන් සිදුකර ගැනීම සඳහා දෙමළ භාෂාව කතා කරන පුරවැසියන්ට අවශ්‍ය පහසුකම් රජය විසින් සපයා දී නොමැත.

මේ වගන්තිවලට ජාතිවාදීන් බලවත් විරෝධතා දැක්වීම නිසා එය නිකම්ම ලියවිල්ලක් බවට පත්විය. පවතින නීති ක්‍රියාත්මක නොකිරීමේ එම සංස්කෘතිය සමග නීති, රීති, චක්‍රලේඛ ආදියෙන් කිසිම පලක් නැත. එම අයිතීන් ලබාදීමේ ආකල්පයක් නැත්නම්, එම අයිතීන් සම්බන්ධ නීති කැඩීම ගැන දඬුවම් ක්‍රියාත්මක වන්නේ නැත.

1956 සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වීමත්, 1958 දෙමළ භාෂා භාවිතය පනත ක්‍රියාත්මක නොවීමත් අතරේ නියමිත කාලසීමාවක් (අවු 3ක්) ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතාව දෙමළ රාජ්‍ය සේවකයන් විසින් ලබාගත යුතුවීම ක්‍රියාත්මක විය. වැටුප් වර්ධක නැවැත්වීම සිදුවේ. මේ තත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි අභියෝග කරමින් දෙමළ රාජ්‍ය සේවකයකු වූ කෝද්දේස්වරන් මහතා කොළඹ දිසා උසාවියේ දැමූ නඩුවෙන් ඔහු ජයගති. ආණ්ඩුව එම තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණයේ නඩුවෙන් තීන්දුව නිෂ්ප්‍රභවිය. එහෙත් කෝද්දේස්වරන් මහතා බ්‍රිතාන්‍ය රාජාධිකරණයට අභියාචනා කළේ ය. එම නඩුවෙන් එය ආ.ක්‍ර. ව්‍යවස්ථාවේ 29(2) උල්ලංඝනය කර ඇති බවත් තීන්දු විය. එම තීන්දුව ලැබෙන විට 1970 පමණ විය. දෙමළ රාජ්‍ය සේවකයන්ගේ භාෂා අයිතිවාසිකම් ලබා දෙනු වෙනුවට ආණ්ඩුව ඓතිහාසික වරදක් කළේ ය. බ්‍රිතාන්‍ය බැම්වලින් නිදහස්වීමට නම් රාජාධිකරණයෙන් ද නිදහස් විය යුතු ය. එසේම නැග ආ ජාතික හැඟීමට ගැලපෙන ලෙසත් ලංකාව ජනරජයක් බවට පත් කළේ ය. එයින් සිදු වූ ඓතිහාසික වරද කුමක් ද?

- 1972, 6 වැනි ව්‍යවස්ථාවෙන් බුද්ධාගම රාජ්‍යාගම බව ප්‍රකාශ කිරීම.
- 1972, 7 වැනි ව්‍යවස්ථාවෙන් 1956/33 පනතින් ප්‍රකාශිත සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට යළි ව්‍යවස්ථාගත කිරීම.

මේ ව්‍යවස්ථා දෙකම කලින් ව්‍යවස්ථාවේ 29(2) ව්‍යවස්ථාවට කෙළින් ම එරෙහි වන්නකි.

ඒ අනුව අන්‍ය ආගම් අදහන අයගේත්, දෙමළ භාෂාව කතා කරන අයගේත් සිත් රිදවීමක් ඇති නොවන්නේ ද? 1966 දී දෙමළ භාෂා විධිවිධාන පනත් දෙකක් සම්මත වී තිබුණත් 1972 ව්‍යවස්ථාවත් සමඟ එම පනත් භාවිතය අත්හැර දැමිණ. මෙසේ භාෂා පනත් නොපනත්කම් වලට හැරීමත් සමග භාෂා සටන, ආයුධ සන්නද්ධ සටනක් විය. ඊට එක් විසඳුමක් වූයේ 1987 දී දෙමළ භාෂාවත් රාජ්‍ය භාෂාවක් ලෙස පිළිගැනීම ය.

එහෙත් "නොකර හැරීමේ" ක්‍රියාව දිගට ම සිදුවිය. 1991 දී එක් විසඳුමක් ලෙස රාජ්‍ය භාෂා කොමිසම පිහිටුවන ලදී. ඉන් පසු ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතට පත්කර තිබිණ. දැන් යළිත් "ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය" වශයෙන් නම හා විෂයයන්ගේ වෙනස්කම් සහිතව නව වැඩ පිළිවෙලක් යොදවා ඇත.

ඩොනමෝර් කොමිසම වාර්තාවේ සඳහන් වූ පරිපාලන සහ විධායක ක්‍රියා මගින් දෙමළ භාෂාවට වෙනස්කම් කිරීම 2005 වන තුරුත් පැවති බවට හොඳම සාක්ෂිය ඇත්තේ 2005 ජූනි මාසයේ රාජ්‍ය භාෂා කොමිසම නිකුත් කළ වාර්තාවෙහි ය. ඒ මෙසේ ය.

> "සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන් ම සිය කටයුතු කරගෙන යා යුතු බවට නම් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල දී මේ දක්වා ම දෙමළ භාෂාව කතා කරන පුද්ගලයන්ට සතුටුදායක සේවාවක් සැපයීමට අපොහොසත් වී සිටියි." (පිටුව 5)

> "සිංහල භාෂාවෙන් පරිපාලන කටයුතු සිදු කෙරෙන ප්‍රදේශයන් හි සිට දෙමළ භාෂාවෙන් සිදුකර ගැනීම සඳහා දෙමළ භාෂාව කතා කරන පුරවැසියන්ට අවශ්‍ය පහසුකම් රජය විසින් සපයා දී නොමැත. එසේ ම එම පුරවැසියන්ට කිසියම් වාර්තාවක, ප්‍රකාශනයක හෝ වෙනත් ලියවිල්ලක දෙමළ භාෂා පිටපතක් හෝ පරිවර්තනයක් ලබා ගැනීමට පහසුකම් නැත. එසේ ම ඔවුන් වෙත නිකුත් කරනු ලබන ලියකියවිලිවල ද දෙමළ භාෂා පර්වර්තනයක් ලබා ගැනීමට ඔවුන්ට හැකියාවක් නොවේ. එසේ ම දෙමළ භාෂාව පරිපාලන භාෂාව සේ පවතින ප්‍රදේශවල දී සිංහල කතා කරන අයට ඉහත කී පහසුකම් සලසා නොමැත." (එම)

මෙසේ පරිපාලනයෙන් හා විධායකයෙන් සිදුවන අසාධාරණකම් නීතියෙන් පමණක් වෙනස් කළ නොහැකි ය. එය අපගේ ක්‍රියාවෙන් ම, චේතනාව ඇතිවම වෙනස් කළ යුතු ය. අප සියලු මිනිසුන් කෙරෙහි ආදරය දක්වන්නේ නම් ඒ ආදරය තේරුම් ගන්නා භාෂාවට ශබ්ද හෝ රූප නැත. වචන නැත. භාෂාව මර්දනයේත්, වෙනස්කම් කිරීමේත්, සැකයේත් උපකරණයක් කර ගැනීම යනු අප මිනිසුන්ට - මිනිස්කමට - ආරවුල් වියවුල් වලට ආරාධනා කිරීම ය. මේ චර්යාව වෙනස් කළ යුතු කාලය ඉක්ම ගියා වැඩි ය.

### සෝල්බරි වාර්තාව දුටු අසාධාරණ ලෙස සැලකීම

ලංකාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට පත් කරන ලද සෝල්බරි කොමිසමේ සාක්ෂි විභාගයේ දී සමස්ත ලංකා දමිළ සංගමය දැක්වූ අදහසක් එම වාර්තාවේ (1945) 41 වැනි පිටුවේ VIII පරිච්ඡේදයෙහි 138 ඡේදය යටතේ මෙසේ දැක්වෙයි.

> "ලංකාවේ දෙමළ ජනයාට ව්‍යවස්ථාදායකයෙන් සිදුවනවාටත් වඩා අසාධාරණ ලෙස සැලකීම සිදුවන්නේ පරිපාලන හෝ විධායක ක්‍රියා මගිනි. නැත්නම් නොකර හැරීම් මගිනි."

මේ සාක්ෂිය සම්බන්ධයෙන් කොමිසමේ අදහස ඊට පහළින් මෙසේ දැක්වේ.

> "සුළුතර ජනතාවක් කෙරෙහි යම් අසාධාරණ සැලකීමක් දැක්වෙන්නේ නම් එසේ සිදුවන්නේ පරිපාලන ක්‍රියා මගිනි : මක්නිසාද, එම ක්‍රියාවන් පහසුවෙන් අල්ලා ගැනීමටත් එළිදරවු කර ගැනීමටත් නොහැකි නිසා ය."

මෙහි දැක්වෙන්නේ අවුරුදු 100කට පමණ පෙර සිට පැවතුණු තත්ත්වයයි. එහෙත් ඇති තරම් නීති රීති තිබුණ ද, පරිපාලන හා විධායක ක්‍රියා මගින් එම වෙනස්කම තවමත් සිදුවන බව පැහැදිලි ය.

ලබන කලාපයට

# භාෂා අයිතිය කඩවීමකදී

# සහන ලබාගන්නේ කෙසේ ද?

තම භාෂා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා නීති පද්ධතියක් මේ රටේ තිබෙන බව මෙරට බොහෝ පුරවැසියෝ දනිති. බොහෝ යන යෙදුම මෙහි යොදා ඇත්තේ නොදන්නා අයත් සිටිය හැකි බැවිනි. කෙසේ වෙතත් එම අයිතීන් තහවුරු වීමට නීති තිබීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැත.

ඒ සඳහා තිබෙන නීති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් තිබිය යුතු අතර නීති කඩවන විට ඊට නිසි ප්‍රතිචාර දක්වන යාන්ත්‍රණයක්ද තිබිය යුතුය.

එසේම තම අයිතීන් කඩවන විට එය නිවැරදි කර ගැනීම සඳහා පුරවැසියන්ගේ මැදිහත් වීම ද අත්‍යාවශ්‍ය පියවරකි.

මේ සියලු දේ සඳහා පුරවැසියන් තුළ තිබිය යුතු දැනුම්වත්භාවය ප්‍රධාන අවශ්‍යතාවයකි.

මීට අදාලව මෙරට පුරවැසියා තම භාෂා අයිතීන් පිළිබඳ දැනුම්වත් වන අතරම එම අයිතීන් කඩ වූ විට ඒ සඳහා ගතයුතු පියවර පිළිබඳවත්, ඒ සඳහා යොමුවිය යුතු ආයතන පිළිබඳවත් නිසි අවබෝධයක් ලබාගත යුතුය. අදින් ඇරඹෙන මෙම ලිපි පෙළ මගින් අප උත්සාහ කරන්නේ භාෂා අයිතියක් කඩ වූ විට ඒ සඳහා සහන ලබාගත හැකි ආයතන පිළිබඳ කරුණු පැහැදිලි කරදීමටය. මෙවර හඳුන්වා දෙන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම පිළිබඳවයි.

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

"ඔබගේ පැමිණිල්ල කොමිසමේ විෂය පථයට අදාල නම් ඒකී පැමිණිල්ල මගින් චෝදනා ලබන පාර්ශවයට ඒ සඳහා උත්තර බැඳීමට අවස්ථාවක් ලබාදී පැමිණිල්ල පිළිබඳව සමතයක් ඇතිකිරීමට මුල් අවස්ථාවේදී උත්සාහ කරනු ලබයි. එසේ කළනොහැකි වුවහොත් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා නිර්දේශයක් ලබාදෙනු ඇත."

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

භාෂා අයිතියක් කඩවූ විටෙක ශ්‍රී ලාංකික පුරවැසියෙකුට ඒ සඳහා සහන ලබාගත හැකි ආයතන හතරක් නීතිය මගින් පිහිටුවා ඇත.

ඒවා නම්

1. ශ්‍රේෂ්ඨාධිකරණය
2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
3. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
4. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්(ඔම්බුඩ්ස්මන්)

මේ අතරින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත භාෂා අයිතියක් කඩවීම පිළිබඳ පැමිණිලි යොමුකල හැකි ආකාරය හා එහි සහන ක්‍රියාවලිය පිළිබඳව මෙම ලිපියෙන් සාකච්ඡා කරමු.

1996 අංක 21 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වාධීන කොමිසමක් ලෙස සැලකේ. මෙම කොමිසමේ බලතල වන්නේ

- මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විමර්ශනය සහ විභාග කිරීම :
- අධිකරණයේ අවසර ඇතිව, අධිකරණ ඉදිරියේ විනිශ්චයට භාජනය වෙමින් පවතින මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳ ඇති නඩු විභාග වලට මැදිහත් වීම:
- පුද්ගලයන් රඳවා ඇති ස්ථාන නිරන්තරව පරීක්ෂා කිරීම මගින් රැඳවියන්ගේ සුබසාධනය නියාමනය කිරීම:
- මානව හිමිකම් ගැටලු පිළිබඳ පර්යේෂණ කිරීම සහ මානව හිමිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම : ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විධානය කරනු ලබන පියවර ගැනීම:
- සාක්ෂි දීම සඳහා කොමිෂම ඉදිරියට පුද්ගලයන් කැඳවීම සහ සාක්ෂිකරුවන් විභාග කිරීම :
- කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය වන හෝ හිතකර වන සියලු පියවර ගැනීම.

**කොමිෂම වෙත යොමුකල හැක්කේ භාෂාව පිළිබඳ කුමන ගැටලුද ?**

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ සියලු දෙනාම නීතිය ඉදිරියේ සමාන බවයි. ඒ අනුව භාෂාව පදනම් කරගෙන රජයේ ආයතනයකින් වෙනස් කමකට ලක්වුවහොත්, රජයේ භාෂා ප්‍රතිපත්තියට පටහැනි ලෙස රජයේ නිළධාරියෙක් කටයුතු කළහොත්, නැතහොත් භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන රජයේ ආයතනයක් උල්ලංඝනය කර තිබේ නම් හෝ 14.1(අ) ව්‍යවස්ථාවෙන් ලබාදී ඇති පරිදි සිය භාෂාවෙන් අදහස් ප්‍රකාශ කිරීමට රජයේ නිළධාරියෙකු බාධා කළහොත් එයින් පීඩාවට පත්වූ අයකුට හෝ ඔහු ඇය වෙනුවෙන් වෙනත් පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට මානව හිමිකම් කොමිසමේ සහන ඉල්ලා සිටිය හැකිය.

**පැමිණිලි ක්‍රමවේදය**

සිය පැමිණිල්ල ලිපියකින් හෝ ප්‍රධාන කාර්යාලයට පැමිණ හෝ ප්‍රාදේශීය කාර්යාලයට යොමුකල හැකිය

**විමර්ශන ක්‍රමවේදය**

ඔබගේ පැමිණිල්ල කොමිසමේ විෂය පථයට අදාල නම් ඒකී පැමිණිල්ල මගින් චෝදනා ලබන පාර්ශවයට ඒ සඳහා උත්තර බැඳීමට අවස්ථාවක් ලබාදී පැමිණිල්ල පිළිබඳව සමතයක් ඇතිකිරීමට මුල් අවස්ථාවේදී උත්සාහ කරනු ලබයි. එසේ කළනොහැකි වුවහොත් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා නිර්දේශයක් ලබාදෙනු ලබයි. කොමිසම ඉදිරියේ පවත්වන පරීක්ෂණයක් සඳහා නීතිඥ පෙනීසිටීමක් අත්‍යවශ්‍ය නොවේ.එමෙන්ම ඒ සඳහා මුද්දර ගාස්තු හෝ වෙනත් කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

**නිර්දේශයේ ස්භාවය**

පැමිණිලි පරීක්ෂණයකදී වගඋත්තරකරුවන් වැරදිබවට හෙලිදරව් වුවහොත් පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ඇත.

- වරද නිවැරදි කරන ලෙසට
- යථාතත්වයට පත්කරන ලෙසට
- වන්දියක් ගෙවන ලෙසට
- නැවත එවැනි උල්ලංඝනයක් සිදුවීම වැළැක්වීමට ප්‍රතිකර්ම යොදන ලෙසට නිර්දේශ කරනු ලබයි.

ව්‍යවස්ථාපිත භාෂා අයිතිතීන් ආරක්ෂා කරගැනීම සඳහා රජය විසින් ඇතිකර තිබෙන සරල, අඩු වියදම් සහිත මෙන්ම දීපව්‍යාප්ත(ශාඛා කාර්යාල 10 ක්) සේවාවක් සලසන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හඳුන්වාදිය හැකිය.

සටහන
**නීතිඥ ජගත් ලියන ආරච්චි**
(එල්.එල්.බී)

# පොලිස් පොතේ පැමිණිලි ගැන

# පොලිසියට එරෙහි පැමිණිල්ලක්



"මේ පැමිණිලි වැඩි ප්‍රමාණයකට පදනම්ව ඇත්තේ දෙමළ භාෂාව කතාකරන පුද්ගලයන්ගේ පැමිණිලි හා ප්‍රකාශ පොලිසියේදී සිංහලෙන් සටහන් කරගැනීම පිළිබඳ සිදුවීමය."

භාෂා අයිතීන් කඩවීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි අතර පොලිස් ස්ථානවල සිදුකෙරෙන භාෂා අයිතීන් කඩවීම පිළිබඳ පැමිණිලි රැසක් ඇති බව වාර්තා වේ.

මේ පැමිණිලි වැඩි ප්‍රමාණයකට පදනම්ව ඇත්තේ දෙමළ භාෂාව කතාකරන පුද්ගලයන්ගේ පැමිණිලි හා ප්‍රකාශ පොලිසියේදී සිංහලෙන් සටහන් කරගැනීම පිළිබඳ සිදුවීමය.

උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පුරවැසියන් වැඩි වශයෙන් මේ ගැටලුවට මුහුණදෙන නමුත් රටේ සෙසු පළාත් රැ සක ද දෙමළ භාෂාව කතාකරන පුද්ගලයන් ද මෙම දුෂ්කරතාවයට මුහුණ දී ඇති බව වාර්තාවේ.

මීට අදාළව වව්නියාව දිස්ත්‍රික්කයේ කරන ලද අධ්‍යයනයකදී හෙළි වී ඇති තොරතුරු මත පදනම්ව වව්නියාව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තුමාට සහ පොලිස්පති තුමාට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක මෙසේ සඳහන්ව ඇත.

- ............. වව්නියාව දිස්ත්‍රික්කයේ සිදුකරන ලද අධ්‍යයනයකදී පැමිණිලිකරුට හෙළිදරව් වී ඇත්තේ වවුනියාව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කොට්ඨාශයට අයත් බොහොමයක් පොලිස් ස්ථාවල දෙමළ පුරවැසියන්ගේ පැමිණිළි හා ප්‍රකාශ සටහන්කර ගැනීම සිදුකරන්නේ සිංහල භාෂාවෙන් බවයි.
- තමන් නොදන්නා භාෂාවකින් සටහන්කරන පැමිණිල්ලකට හෝ ප්‍රකාශයකයට තම අත්සන යෙදීමට සිදුවීම නිසා දෙමළ භාෂාව කථාකරන පුරවැසියන්ට සිය නීතිමය කටයුතුවලදී අවාසිදායක තත්වයකට පත්වීම මෙන්ම වෙනස්කමකට භාජනය වීමද සිදුවේ.
- මෙම තත්වය නිසා දෙමළ භාෂාව කථාකරන පුද්ගලයන් දැඩි අපහසුතාවයට හා අසාධාරණයට ලක්වන බවටද තොරතුරු ලැබිණි.
- මෙම පොලිස් කොට්ඨාශයතුල සිටින ජනගහනයෙන් අතිබහුතරය දෙමළ භාෂාව සිය මව් බස ලෙස භාවිතාකරන්නන් බවද පැමිණිලිකරු කියා සිටියි.
- එසේම වවුනියාව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කොට්ඨාශය උතුරු පළාතේ පිහිටි පොලිස් කොට්ඨාශයක් වන අතර, 16වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 21(1) ව්‍යවස්ථාවට අනුව මෙම ප්‍රදේශියේ පරිපාලන භාෂාව දෙමළ බවද පැමිණිලිකරු අවධාරණය කර සිටියි.
- එමෙන්ම 16වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 22(2) ව්‍යවස්ථාව දක්වා සිටින්නේ තම නිල තත්වයෙන් ක්‍රියාකරන නිළධාරයෙකු නොවන තැනැත්තෙකුට යම් නිළධාරියෙකු සමග නිල තත්වයෙන් කටයුතු කිරීමේදී අදාලත්වය අනුව සිංහල,දෙමළ භාෂාවන්ගෙන් සිදුකිරීමට අයිතිය ලබාදී ඇති බවයි.
- පොලිස් ස්ථානයක පැමිණිලි සටහන් කිරීමේදී හා ප්‍රකාශ සටහන් කිරීමේ දී සිංහල භාෂාව මව්බස ලෙස භාවිතාකරන පුරවැසියන්ගෙන් සිංහල භාෂාවෙන් සටහන් කර ගැනීමත් දෙමළ බස මව්බස ලෙස භාවිතා කරන්නන්ට සිය මව්බසින් පැමිණිළි හා ප්‍රකාශ සටහන්කර ගැනීමට අවස්ථාවක් නොලැබීමත් මගින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂාකරදී ඇති "නීතිය පසිදලීමේදී සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම දෙමළ මව්බස ලෙස භාවිතාකරනන් විෂයෙහි මෙම පොලිස් ස්ථානවල නිළධාරීන් විසින් උල්ලංඝනය කරන බව පැමිණිලිකරු කියා සිටියි.
- එමෙන්ම මෙම ක්‍රියාවලිය නිසා වවුනියාව ප්‍රදේශයේ පදිංචි දෙළ බස භාවිතාකරන පුරවැසියන් සතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඊ) ව්‍යවස්ථාවේ සඳහන් "එකලාව හෝ අන් අය සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්තිවිඳීමේ හා වැඩිදියුනු කිරීමේ සහ ස්වකීය භාෂාව භාවිතා කිරීමේ නිදහසද" උල්ලංඝනය වන බව පැමිණිලිකරු කියා සිටියි.
- වවුනියා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කොට්ඨාශය තුල පිහිටි පොලිස් ස්ථානවල දෙමළ භාෂාව හැසිරවිය හැකි පොලිස් නිළධාරීන් ප්‍රමාණවත් නොවීම මෙම තත්වය ඇතිවීමට ප්‍රධාන හේතුවක් බවද පැමිණිලිකරුට හෙළිදරව් වී ඇත.
- එබැවින් එම කොට්ඨාශය භාර ප්‍රධාන නිළධාරියා ලෙස 1වන වගඋත්තරකරු මෙම මූලික අයිතිවාසිකම් උල්ලංඝනයට වගකිව යුතු බවද කියා සිටියි.
- එසේම දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස දෙවන වගඋත්තරකරුද මෙම මූලික අයිතිවාසිකම් උල්ලංඝනයට වගකිවයුතු බව කියා සිටියි.
- දෙමළ භාෂාවෙන් පැමිණිලි හා ප්‍රකාශ සටහන් කර නොගැනීම මගින් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට එරෙහිව පොලිසියට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට එම අද්දැකීම්වලට මුහුණදුන් පුද්ගලයන් බියක් දක්වන බවද පැමිණිලිකරු කියා සිටියි.
- 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 14වන වගන්තිය යටතේ "අතෘප්තියට පත් තැනැත්තන් සමූහයක් වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තෙකු" ලෙස මෙම පැමිණිලිකරුට මෙම පැමිණිල්ල කොමිසම ඉදිරියේ පවරා පවත්වාගෙන යාමේ නීතිමය හැකියාව තිබෙන බවද පැමිණිලිකරු ප්‍රකාශකර සිටියි.

ඉහත කී කරුණු අනුව පැමිණිලිකරු ගරු කොමිෂන් සභාවෙන් අයැද සිටින්නේ

(අ). පැමිණිල්ලේ සඳහන් පරිදි දෙමළ බස භාවිතා කරන්නන්ගේ පැමිණිළි හා ප්‍රකාශ පොලිසිය විසින් සිංහල භාෂාවෙන් සටහන් කිරීම මගින් දෙමළ බස භාවිතා කරන ප්‍රජාව සතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කල අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදුවන බවට නිර්දේශයක් ලබාදෙන ලෙසත්,

(ආ). එමෙන්ම එම ක්‍රියා කලාපය මගින් එම පිරිස සතු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඊ) ව්‍යවස්ථාව මගින් සහතික කල අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට නිර්දේශයක් ලබාදෙන ලෙසත්,

(ඇ). ඉහත මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන්ට පළමු හා දෙවන වගඋත්තරකරුවන් වගකිව යුතු බවට නිර්දේශයක් ලබාදෙන ලෙසත්,

(ඈ). මෙම තත්වය දිගින දිගටම සිදුවීම වැළැක්වීම සඳහා කඩිනම් ප්‍රායෝගික ප්‍රතිකර්ම යොදන ලෙසට පළමු හා දෙවන වගඋත්තරකරුවන්ට නිර්දේශ කරන ලෙසත්,

(ඉ). කොමිෂන් සභාවට මනාප වෙනත් හා වැඩිමනක් සහන නියෝග නිකුත්කරන ලෙසත් වේ.

## මානව හිමිකම් කොමිෂම වෙත පැමිණිලි ගලා එයි... 4 පිටුවෙන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | ස්ථානාධිපතිතුමා දුම්රිය ස්ථානය පේරාදෙණිය හා සාමාන්‍යාධිකාරිතුමා දුම්රිය දෙපාර්තමේන්තුව | දුම්රිය ස්ථානවලදී දෙමළ භාෂාවෙන් දුම්රිය ගමන් පිළිබඳ උපදෙස් විකාශනය නොකිරීම පිළිබඳ පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | (07/11/2011) | Registerd Post 2011-12-05 |
| 13 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා මන්නාරම හා පොලිස්පති තුමා | මන්නාරම පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථානවල දෙමළ භාෂාව කථාකරන පුද්ගලයන්ගේ පැමිණිළි හා ප්‍රකාශ පොලිසිය විසින් සිංහල භාෂාවෙන් සටහන් කිරීම පිළිබද පැමිණිල්ල | ප්‍රධාන කාර්යාලය කොළඹ | 08/11/2011 | HRC/3466/2011 |
| 14 | නගරාධිපතිතුමා මහනගර සභාව කල්මුණේ | වීදි නාමපුවරු වල වීදිනාම සිංහල භාෂාවෙන් සඳහන් නොවීම පිළිබඳ පැමිණිල්ල | ප්‍රාදේශිය කාර්යාලය කල්මුණේ | 08/11/2011 | HRC/KL/178/11/R |

## භාෂා හා සංවර්ධන ජාත්‍යන්තර සමුළුව.. 6 පිටුවෙන්

සාධක දෙකකට සුවිශේෂ අවධාරණයක් ලබා දීමයි. ඉංග්‍රීසි භාෂාව ජීවන කුසලතාවන් ලෙස දකින අපි ජීවිතයෙහි සාර්ථකත්වය ලබාගෙන ගෝලීය වැසියන් වීමට අපගේ දරු දැරියන්ට එමගින් හැකිවේවායි අපි විශ්වාස කරමු.

කලා ක්ෂේත්‍රයෙහි ද ඉතා වැදගත් කාර්යභාරයක් භාෂාව ඉටු කරන බව ද අපි දකිමු. භාෂාවන් බද්ධවීම සහ විවිධ සංස්කෘතීන් අතර අන්තර් සම්බන්ධතාව මගින් සමාජය තුළ සංස්කෘතික රටාවන් පෝෂණය වීම සහ කලාවන්ගේ ප්‍රමිතීන් නැංවීම සිදුවේ.

මෙම සමුළුවෙහි ඉතා සම්භාවනීය පිරිසක් සිටිති. ඔවුන් විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන අතර භාෂාවෙහි විවිධ තලයන් ගැන පුළුල් අත්දැකීම් සහිත අය බව ද දනිමු. ඔබගේ සංවාද සඳහා කදිම න්‍යාය පත්‍රයක් තිබෙනවා. අප කාලයක් තිස්සේ මුහුණ දෙන භාෂාව පිළිබඳ ගැටලුවට ඔබගේ සංවාද මගින් විසඳුම් සොයා ගත හැකි බව මම තරයේ විශ්වාස කරමි.

සියලු විදේශීය නියෝජිතයන් මම උණුසුම් ලෙස පිළිගනිමි. අප ජනතාවගේ සත්කාරය හා මිත්‍රත්වය පිළිබඳ අගනා මතකයන් ඔබ සිත් තුළ රැඳී සිටින බව මම විශ්වාස කරමි. මෙම සමුළුව සාර්ථක වේවා යි මම ප්‍රාර්ථනා කරමි.

**විද්‍යාත්මක කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මහාචාර්ය තිස්ස විතාරණ මහතා**

ලොව විවිධ රටවල ජනතාව අතර පවතින සංස්කෘතික හා භාෂා වෙනස්කම් නිසා ඔවුන් හා සමීපවීමට අපට එය බාධාවක් වී තිබෙනවා.

තමන්ගේ මවු භාෂාවට ගරු කරන ආකාරයටම ලොව ඕනෑම රටක ඕනෑම භාෂාවකට ද ගරු කිරීමට අප පුරුදු විය යුතුයි.

ඉංග්‍රීසි භාෂාව ජාත්‍යන්තර තලයේ සම්බන්ධීකරණ භාෂාවක් ලෙස පුළුල් ලෙස භාවිත වනවා. අඩුම තරමින් අප ජාත්‍යන්තර භාෂා එකක් හෝ ඉගෙන ගත යුතුයි. වත්මන් ලොව දැනුම හුදෙකලා වී නැහැ. ආර්ථික සංවර්ධනය සඳහා මූලික වී තිබෙන්නේ දැනුමයි.

මෙම සමුළුව ජාත්‍යන්තර භාෂා දැනුම වැඩිකර ගැනීමට අවස්ථාවක් කර ගත යුතුයි. එවිට අපට බොහෝ ගැටලු ප්‍රශ්න බෙදා හදා ගත හැකි වෙනවා. මෙවර මෙම සමුළුව පැවැත්වීමට ශ්‍රී ලංකාව තෝරා ගැනීම ඉතාමත් කාලෝචිතයි. භාෂා සම්බන්ධයෙන් ලොව ඉදිරිපිට ඇති මේ අභියෝගය අප බාර ගන්නවා.

**ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා**

දශක ගණනාවක් එක දිගට ඇදුණු සිවිල් යුද්ධයක් අවසන් වීමෙන් පසුව මෙවැනි සමුළුවක් අප මෙහි පැවැත්වීමට ලැබීම ඓතිහාසික අවස්ථාවක්. මෙය අප රටට ලැබුණු වරප්‍රසාදයක් ලෙස සැලකිය හැකියි.

ඕනෑම රටක භාෂාවක් නැතිව සංස්කෘතියක් පවතින්නේ නැහැ.

විවිධ අදහස් හුවමාරු කර ගැනීමටත් සමාජ සම්බන්ධතා ඇති කර ගැනීමටත් භාෂාව ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරනවා.

ලේ ගලා හැලුණු යුද්ධය අවසන් කළ පසුව එතෙක් අප සමාජයේ ජන කොටස් දෙකක් අතර දුරස්ව තිබූ සමාජ සම්බන්ධතාව යළි ඇති කිරීමට අප පියවර ගනිමින් සිටිනවා. එමගින් සමාජ පරිවර්තනයක් සඳහා අවශ්‍ය වැඩසටහන් සකස් කරනු ලබනවා.

භාෂාවත් සංහිවේදනයත් මගින් මනුෂ්‍යත්වය උපරිම තලයකට ගෙන එනවා.

සියලු ප්‍රජාවන් සහයෝග යෙන් කටයුතු කරන ශ්‍රී ලංකාවක් අප බලාපොරොත්තු වෙනවා.

ජර්මන් තානාපති ජෙනිස් ප්ලෝම්නර්, අධ්‍යාපන අමාත්‍යාංශයේ දෙමළ පාසල් සංවර්ධන අධ්‍යක්ෂ එස්.පී. මුරලිදරන් යන මහත්වරු සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් එම්.එස්. වික්‍රමසිංහ මහත්මිය ද මෙහිදී කතා කළහ.

## මව් බස අහිමි මුහුදු වැදි ජනයා

7 පිටුවෙන්....

වගකීම් ඔහුට පැවරී ඇත. උප්පැන්න සහතික නොමැති හෙයින් ඇතැම් අය සඳහා හැඳුනුම් පත් සැකසීම දුෂ්කර ව ඇතැයි ඔහු පවස යි.

''තුන් හතර වතාවක් ම බස් එකක් ඉල්ලලා ඩිපෝවලට දැනුම් දුන්නා අදවන තුරු උත්තරයක් නැහැ. දෙන්න බස් එකක් නැතිලු. හැමදේම එහේම තමයි. එහෙත් අපි මේ අයට සහනයක් දෙන්න හැමවිටම උත්සාහ කරනවා.''

ලබන අවුරුද්ද වෙනකොට විදුලිය දෙන බව මණ්ඩලය කියනව. රතු කුරුසෙන් ස්වයං රැකියා කරන්න ආධාර දීල තියෙනව. කොහොම උනත් මේ ආදිවාසීන්ගෙ ජීවිත ආරක්ෂාව සහතික කරන එක අපේ වගකීමක්. ග්‍රාම නිළධාරිවරයා පවසයි.

ලංකාවෙ ආදිවාසි ජනතාව ප්‍රදේශ ගණනාවක ජීවත්වනු පෙනුණත් ස්වකීය භාෂාමය හා සංස්කෘතිමය අනන්‍යතාව සහමුලින්ම මැකී යන පිරිසක් බවට පත්ව ඇත්තේ වාකරේ ආදිවාසීන්ය. විශේෂත්වය වන්නේ දෙමළ හා මුස්ලිම් ජන වර්ග දෙකම සමඟ සංහිඳියාවෙන් යුතුව ජීවත් වන්නට ඔවුන් යත්න දැරීමය. එහෙත් ආර්ථික වශයෙන් ශක්තිමත් වීමේදී ඔවුන් තවමත් සිටිනුයේ මෙකී ජන වර්ග දෙකට වඩා පසුපසිනි.

*ශ්‍රී ලංකාවේ කොන්වූ ජන සමාජ කිහිපයක් ආශ්‍රයෙන් කරන ලද අධ්‍යයන වාර්තාවකින් උපුටා ගන්නා ලදී. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් අංශයෙහි ප්‍රකාශනයකි.*

**සටහන: තිඹිරියාගම බණ්ඩාර**

# ප්‍ර ති චා ර

විභාෂා පුවත් හසුනෙහි මංගල කලාපය පරිශීලනය කළ පාඨකයන් රැසකගෙන් මේ වන විට අප වෙත ප්‍රතිචාර රැසක් ලැබී ඇත.

පුවත් හසුනේ ඉදිරි ගමනට සුබ පතන අතර එය තවදුරටත් සංවර්ධනය කිරීමට ඉවහල් වන යෝජනා හා අදහස් රැසක් ඒ අතර විය.

එබඳු ප්‍රතිචාර, යෝජනා හා අදහස් අතරින් තෝරාගත් සටහන් කිහිපයක් පහත පළවේ. ඔබේ සියලු ප්‍රතිචාර බෙහෙවින් අගයකරන අතර තව දුරටත් එබඳු ප්‍රතිචාර අපේක්ෂා කරමු.

**සංස්කාරක**

## සුබ පැතුම්

භාෂා ගැටලුව යනු ශ්‍රී ලංකාව තම ඉතිහාසයේ මුහුණ දුන් ගැටලු අතරින් ප්‍රධානම ගැටලුවකි. දේශපාලනඥයන් මෙන්ම මේ රටේ පැවති ජනමාධ්‍යද ඊට වගකිවයුතු බව මගේ විශ්වාසයයි. ප්‍රශ්නය තව තවත් උග්‍ර කිරීමට මිස විසඳීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ඔවුන්ගෙන් නොලැබිණි.

එවැනි පසුබිමක් යටතේ විභාෂා වැනි පුවත් සඟරාවක් දකින්නට ලැබීමත් සතුටකි. මෙරට භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ඉවහල්වන කරුණු රැසක් එමගින් ප්‍රකාශයට පත්කර තිබිණි. මේ රටේ භාෂා ගැටලු විසඳමින්, ඔවුනොවුන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා විභාෂා සඟරාව දරන උත්සාහයට සුබ පතමි.

**එන්. ප්‍රියන්ත - පනාගොඩ**

## සංස්කෘතික ගැටලු ගැනත් හිතන්න

ශ්‍රී ලංකාවේ සිංහල හා දෙමළ ප්‍රජාව අතර සංවාදයක් ගොඩනැගීමේ දී ඔවුනොවුන්ගේ භාෂාවන් පිළිබඳ අවධානය යොමු කිරීම ඉතා ප්‍රයෝජනවත්. විභාෂා සඟරාව ඒ වෙනුවෙන් කටයුතු කරන බව පැහැදිලියි.

මෙහිදී භාෂාව පිළිබඳව මෙන්ම ඔවුනොවුන්ගේ සංස්කෘතීන් පිළිබඳව ද අවධානය යොමුකළ හැකි නම් වඩා ප්‍රයෝජනවත් බව මගේ අදහසයි. ඊට හේතුව ලෙස මා දකින්නේ භාෂාව හා සංස්කෘතිය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් තිබීමයි.

ඉදිරියේ දී විභාෂා සඟරාව ඒ පිළිබඳ අවධානය යොමුකරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්.සුහයිබ් - මරදාන**

## ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනයේ ගැටලු රැසක්

ශ්‍රී ලංකාව තුළ ද්විභාෂා සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා මෙවැනි පුවත් සඟරාවකින් කළහැකි මෙහෙවර විශාලය. සිංහල හා දෙමළ භාෂා පිළිබඳව මෙන්ම, එහිදී ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය පිළිබඳව ද ඔබගේ අවධානය යොමුවන්නේ නම් යෙහෙකි.

පසුගිය කාලයෙහි මේ රටේ ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය බිඳවැටීම නිසා සිදු වූ හානිය අති විශාලය. මේ වන විට අපි ඒ පාඩුව විඳිමින් සිටිමු.

ඊට මුහුණ දීම සඳහා මේ වන විට පාසැල් අධ්‍යාපනයට ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය හඳුන්වා දෙමින් ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනයට ද අවස්ථාව ලබා දී ඇත. ඒ අනුව දැන් රටේ සැලකිය යුතු සිසුන් පිරිසක් ස්වභාෂා මාධ්‍ය වෙනුවට ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය තෝරාගෙන ඇත.

සාමාන්‍ය පෙළ දක්වා මේ ගමන සාර්ථකව යන සිසුන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උසස් පෙලට සුදානම් වීමේදී බරපතල ගැටලු රැසකට මුහුණ දෙති. ඒ ගුරු හිඟය හා අනෙකුත් සම්පත් හිඟය නිසාය. එබැවින් බොහෝවිට වෙනත් පාසැල් සොයා යාමට මෙම සිසුන්ට සිදුවී ඇත. මෙය අද රටේ තමන් කැමති භාෂා මාධ්‍යයකින් අධ්‍යාපනය ලැබීමට ඉදිරිපත් වන සිසු සිසුවියන් මුහුණ දෙන බරපතල ගැටලුවකි.

මෙබඳු ගැටලු පිළිබඳව ද විභාෂා සඟරාව ඉදිරයේදී තම අවධානය යොමුකරන්නේ නම් ඉතා අගනේය.

**ප්‍රියානි මාරසිංහ - දෙල්කඳ**

## වතුකරයේ ගුරුවර ගුරුවරියන් හරි අඩකට නිසි පුහුණුවක් නෑ

වතුකරයෙහි පාසැල් ගුරුවර ගුරුවරින් අතරින් හරි අඩකටම නිසි පුහුණුවක් ලැබී නැති ඇති අතර ඇතැම් පාසැල්වල පුහුණුව ලැබූ එකදු ගුරුවරයකු හෝ නොමැති බව උඹව, පස්සර කළාපයේ කරන ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත.

මෙම තොරතුරු හෙළි වී ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර අධ්‍යාපන කොට්ඨාශයේ වතුකරයේ ළමුන් වැඩිපුරම ඉගෙනුම ලබන පාසැල් 21ක් තෝරාග නිමින් ට්‍රාන්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කරන ලද සමීක්ෂණයකදීය.

මෙම කලාපයේ දී හමුවූ ගුරුවර ගුරුවරියන්ගෙන් අඩකට පමණ ඔවුන්ගේ බසින් පත්වීම් ලිපිය ලැබී නොතිබුණු බවද එම සමීක්ෂණ වාර්තාව කියයි. මේ අනුව වතුකරයේ ගුරුවර ගුරුවරියන් රැසක් සේවයේ යෙදෙන්නේ තම සේවා කොන්දේසි පිළිබඳව පවා අවබෝධයකින් තොරවය.

## මොනරාගල දිස්ත්‍රික්කයේ භාෂා සංගම් පිහිටුවීම ඇරඹේ



මොනරාගල දිස්ත්‍රික්කයෙහි භාෂා සංගම් වැඩපිළිවෙල ආරම්භ කරමින් ප්‍රථම භාෂා සංගමය පිහිට වූ අවස්ථාව.

මොනරාගල දිස්ත්‍රික්කයෙහි භාෂා සංගම් පිහිටුවීමේ වැඩපිළිවෙල මානව හිමිකම් හා ප්‍රජා සංවර්ධන ආයතනයේ මෙහෙයවීමෙන් 2011 නොවැම්බර් මස 19 වැනිදා මොනරාගල නගරයෙන් ආරම්භ විය.

මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ පිහිටුවන ලද භාෂාසංගම් 19ක් දැනටමත් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශයෙහි ලියාපදිංචි කර ඇති අතර ඉදිරියේදී දස්ත්‍රික්කය තුළ තවත් සංවිධාන රැසක් පිහිටුවීමට සැලසුම් කර ඇත.

# අපට ලියන්න

ශ්‍රී ලංකාවේ භාෂා පිළිවෙත බෙහෙවින් සංවාදයට බඳුන් වූ මාතෘකාවකි. විභාෂා පුවත් හසුන මගින් අප උත්සාහ කරන්නේ එම සංවාදය තව දුරටත් පෝෂණය කිරීමටය.


මෙම සංවාදය ගොඩනැගීමේ දී පාඨක ඔබගේ දායකත්වය ද අතිශය වැදගත් බව අපගේ විශ්වාසයයි. ඔබ සතු විවිධ අදහස්, තොරතුරු, පුවෘත්ති, අප වෙත ලියා එවන්න.

විභාෂා පුවත් හසුන මෙරට භාෂා අයිතිය පිළිබඳ සංවේදී ඔබ සැම වෙනුවෙන් විවෘත ය.

**භාෂා අයිතිය පිළිබඳ**

ඔබේ අදහස්, යෝජනා ප්‍රතිචාර ගැටළු අප වෙත යොමු කරන්න.

සංස්කාරක,
විභාෂා පුවත් හසුන,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
24/2, 28 වෙනි පටුමග,
මල්පාර, කොළඹ 07
දුරකථනය : 0112 370801/4 ෆැක්ස් : 0112 370802



# භාෂා අයිතීන්ට

## සංවේදී වීම...

“

භාෂා අයිතීන් පිළිබඳ නොතකා කටයුතු කිරීම ද රටක මානසික සෞඛ්‍යයට අහිතකර බව මානසික සෞඛ්‍යය ඒකකය තේරුම් ගත යුතු ය. මානසික සෞඛ්‍යයට පමණක් නොව, එය ශාරීරික සෞඛ්‍යයට ද අහිතකර බව මේ රටේ පැවති තිස් අවුරුදු යුද්ධය සාක්ෂි දරයි.

”




දරුවන්ට සංවේදීව - භාෂා අයිතීන්ට අසංවේදීව




නිරෝගිමත් භාෂා භාවිතයක්

“හොඳම දේ දරුවන්ට” යනු හොඳම කියමනකි. එවැනිම තවත් හොඳ කියමනක් ඇත. ඒ “අපේ දරුවන් සතුටින් තබමු” යන කියමනයි.

ඒ සඳහා සමාජය දැනුම්වත් කරන ප්‍රචාරක පුවරු සවිකිරීම ද තවත් හොඳ දෙයකි.

එනිසා කොළඹ ඇස්වාට්ටුවේ ලිප්ටන් වරටවුමට දිස්වන අයුරින් ප්‍රදර්ශනය කෙරෙන “අපේ දරුවන් සතුටින් තබමු” යන ප්‍රචාරක පුවරුව හොඳ වැඩක් බව එකහෙළා කිව හැකි ය.

එහෙත් එම පුවරුව එක් භාෂාවකින් පමණක් ප්‍රදර්ශනය කිරීම නම් හොඳ වැඩක් යැයි කිසිසේත් කිව නොහැකි ය. ඊට හේතුව එහි දී මෙම පුවරුව ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු කළ මානසික සෞඛ්‍ය ඒකකය මේ රටේ භාෂා අයිතීන් පිළිබඳව සංවේදී තාවයකින් යුතුව කටයුතු කර නැති නිසා ය.

භාෂා අයිතීන් පිළිබඳ නොතකා කටයුතු කිරීම ද රටක මානසික සෞඛ්‍යයට අහිතකර බව මානසික සෞඛ්‍යය ඒකකය තේරුම් ගත යුතු ය. මානසික සෞඛ්‍යයට පමණක් නොව, එය ශාරීරික සෞඛ්‍යයට ද අහිතකර බව මේ රටේ පැවති තිස් අවුරුදු යුද්ධය සාක්ෂි දරයි.

මේ පුවරුව මගින් මෙරට රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති උල්ලංඝනය කර ඇතැයි යන චෝදනා යටතේ සෞඛ්‍ය ඒකකයට එරෙහිව නීතිමය පියවර ගැනීමට රාජ්‍ය භාෂා කොමිෂන් සභාව තීරණය කර ඇතැයි මීට මාස කීපයකට පෙර ප්‍රවෘත්තියක් පළ වී තිබිණි.

2011 සැප්තැම්බර් මස 19දින ලංකාදීප පුවත්පතෙහි පළවී තිබූ එම ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන් මෙසේ විය.

**“ජාතික රෝහලේ මානසික සෞඛ්‍ය ඒකකයට නඩු?**

**රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ තීරණයක්”**

*රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීමේ චෝදනාව යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මානසික සෞඛ්‍ය ඒකකයට එරෙහිව නීතිමය පියවර ගැනීමට රාජ්‍ය භාෂා කොමිෂන් සභාව තීරණය කරයි.*

*කොළඹ ඇස් වාට්ටුවේ ලිප්ටන් වටරවුමට දිස්වෙන අයුරින් ජාතික රෝහලේ මානසික සෞඛ්‍ය ඒකකය සවිකර ඇති “අපේ දරුවන් සතුටින් තබමු” යන ආදර්ශ නියමු පුවරුව භාෂා තුනෙන් යුක්තව සකස් කරන ලෙසට කළ දැනුම් දීම නොසලකා හැරීම මීට හේතු වී ඇතැයි එම කොමිසමේ සභාපති නිමල් රණවක මහතා පවසයි.*

*රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුව එම ප්‍රචාරක පුවරුව ත්‍රෛභාෂාවෙන්ම යුක්ත විය යුතු බවට මීට පෙර කිහිප වතාවක්ම සෞඛ්‍ය අමාත්‍යංශයේ මානසික සෞඛ්‍යය ඒකකයට දන්වා යවා ඇතැයි ද ඒ මහතා කියයි.”*

මේ ප්‍රවෘත්තිය පළවී අද වන විට මාස තුනකුත් ගත වී ඇති නමුත් තවම එම පුවරුවෙහි කිසි වෙනසක් සිදු වී නැති බව මෙහි පළවන ඡායාරූපය ද සාක්ෂි දරයි.

එහෙත් එම පුවරුවට අඩි කිහිපයක් ඔබ්බෙන් ඉදිකර ඇති මහජන සෞඛ්‍යයට අදාල තවත් ආදර්ශ නියමු පුවරුවකින් කාට කාටත් හොඳ ආදර්ශයක් සපයා ඇත. එය කාට කාටත් පෙනෙන ලෙස සිංහල හා දෙමළ භාෂා දෙකම යොදා ගනිමින් ඉහත කී මානසික සෞඛ්‍ය පුවරුව අසළින්ම ඉදිකර තිබේ.

කාට පෙනුනත් එය තවම මානසික සෞඛ්‍ය ඒකකයේ ලොකු ලොකු උදවියට නම් පෙනී ඇති බවක් දක්නට නැත. එසේ පෙනුනා නම් අඩුම ගණනේ ඒ මගින්වත් ආදර්ශයක් ලබාගෙන තම පුවරුවේ වරද නිවැරදි කර ගැනීමට ඔවුනට ඉඩ තිබුණි.

එහෙත් මේ දක්වා එහි අකුරුක්වත් නිවැරදි වී නැත. ඒ සඳහා බලපාන විවිධ හේතු තිබිය හැක.

එක්කෝ එය මානසික සෞඛ්‍යය ඒකකයේ මානසික ගැටලුවක් නිසා විය හැකි ය. එසේ නැත්නම් ශාරීරික දුබලතාවක් නිසා විය හැකි ය.

රෝගය කුමක් වුවද අවසානයේ රෝග පීඩාව මුළු රටටම ය. එබැවින් කඩිනම් ප්‍රතිකාරයක් මේ සඳහා අවශ්‍යව තිබේ.

Printed by: Globe Printing Works, No.5 Stork Place, Colombo 10. Tel: 0777315971